භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2025 ජූලි - අගෝස්තු | 126 වන කාණ්ඩය - 04 කලාපය | පිටු 32 | DOP/NEWS/02/2025

## වන්දනා ගමන




ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# නව ලොවක් අපට ඇත

ගී පද - එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා
තනු නිර්මාණය - උපුටා ගත්තකි



නව ලොවක් අපට ඇත කොතැනක හෝ
පොරොන්දු දේශය යයි පවසන්නේ
දිව එමි මම එතනට කවදා හෝ
සුරතේ දැවටී ඔබගේ
අවැසිය රැඳෙන්න ඔබගේ සෙවණේ
නොමැතිය බාධාවක් කොතැනක හෝ
දනිමි නැත කිසිදා හමු වන්නේ
ඔබ වැනි ඇදුරකු මෙලොවේ

කවුරුන් හෝ සැමටම සිටිනා බව
ඇසේය අප හට නිරතුරු දසතේ
සැම මොහොතක සදහට මා දිවියේ
ඒ ඔබ වුව මැන සමිඳේ
සොයනෙමි මම මේ ලෝකයේ සැමතේ
දිවි මඟ නිම වන තුරු දිවා රැයේ
දනිමි නැත කිසිදා හමුවන්නේ
ඔබ වැනි ඇදුරකු මෙලොවේ

වන්දනා ගමනකි දිවි මෙලොවේ
හිඳිනු මැනවි මා හා සැඩ සයුරේ
බාධා අවහිර මැඬලා යන සේ
අරකිනු අරකිනු මැන මා සමිඳේ
නැත මට කිසි සැපතක් මේ දිවියේ
ලැබුණ ද මට යස ඉසුරු
නැති වුවහොත් ඔබ පෙම දෙව් සමිඳේ
නොදනිමි මම කරනා දෙය මෙලොවේ
දනිමි නැත කිසිදා හමුවන්නේ
ඔබ වැනි ඇදුරෙකු මෙලොවේ

මිනිස් ජීවිතය යනු කුමක් ද? එහි අරුත රැඳී තිබෙන්නේ කොතැන ද? එහි අවසාන අභිප්‍රාය විය යුත්තේ කුමක් ද?

භෞතිකත්වයෙන් එපිට රැඳි මෙවන් ලෝකෝත්තර පැනයන්ට, දර්ශනවාදයෙන් හෝ විද්‍යාවෙන් පමණක් පිළිතුරු සෙවිය නොහැක. ගරු එමාඩ් දල්පතාදු පියනම විසින් රචිත "නව ලොවක් අපට ඇත" ගීතිකාව එවන් පැනයනට කිතු දහමින් ලබා දෙන ආධ්‍යාත්මික පිළිතුරු පාදක කරගෙන තැනෙන්නක් ලෙසින් විග්‍රහ කළ හැකි ය.

ඕස්ට්‍රේලියානු ජාතික "The Seekers" සංගීත කණ්ඩායම විසින් 1964 වර්ෂයේ දී ගායනා කරන ලද "I'll Never Find Another You" නමැති මුල් ගීතය ආශ්‍රයෙන් තැනෙන සිංහල ගීතිකාව, ආරම්භයේ දී ම අප සිත් තුළ නැවුම් බලාපොරොත්තුවක් ජනිත කරන්නට සමත් වෙයි. "නව ලොවක් අපට ඇත කොතැනක හෝ" යන්නෙන් පසක් කර දෙන්නේ කිතු දහමේ මූලික සිද්ධාන්තයක් වන, මේ පෘතුවි තලය මත ගෙවන කෙටිකාලීන ජීවිතය නොව ඉන් ඔබ්බට දිවෙන සදාකාලික ජීවිතයක් මිනිසාට උරුම බව ය. එම ස්වර්ගීය ජීවිතයට උරුමකම් කීමට අප වරම් ලැබුවේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නම් වූ ගුරු ඇඳුරාණන් නිසා ය. මිනිස් බව ගත් දේව පුත්‍රයාගේ මරණයෙන් මතු උත්ථානය නිසා ය. එබැවින් රචකයා මෙසේ කිතු සමිඳුන් පසසයි. "දනිමි නැත කිසිදා හමුවන්නේ - ඔබ වැනි ඇදුරෙකු මෙලොවේ"

මෙලෝ දිවියේ තාවකාලික භාවය ගැන දෙවැනි කවිය ඇරඹුමේදී ද ඉඟි සපයයි. "වන්දනා ගමනකි දිවි මෙලොවේ". නමුත් රචකයා කිතු සමිඳුන්ට ආයාචනා කරන්නේ දිවි ගමන අවසන් වන තුරු ඔහුගේ ගමන් සහකරු වන ලෙසට ය. පැමිණෙන බාධා, දුක් කම්කටොළුවල දී අත් නොහැර ම හිඳිනු ලෙසට ය.

"හිඳිනු මැනවි මා හා සැඩ සයුරේ - බාධා අවහිර මැඬලා යන සේ - අරකිනු අරකිනු මැන මා සමිඳේ"

මිනිස් ජීවිතයේ වටිනාකම රැඳී ඇත්තේ මෙලොව රැස්කර ගන්නා වස්තූන් හෝ යස ඉසුරු මත නොවන බවත් ගීතය පාඨකයාට පසක් කර දේ. සදා නොවෙනස් එකම 'වස්තුව' දේව ප්‍රේමය පමණක් බව ද එයට පමණක් ඇලී ගැලී සිටීමෙන් ජීවිතය ප්‍රීතියෙන් ගත කළ හැකි බවත් තවදුරටත් එය පැහැදිලි කරයි. "නැති වුවහොත් ඔබ පෙම දෙව් සමිඳේ - නොදනිමි මම කරනා දෙය මෙලොවේ"

එබැවින්, පෙර කියූ සේ ම. මෙම ගීතය අපට ගෙන හැර දක්වන්නේ මිනිස් ජීවිතයේ සැබෑ අරුත යි. කිතුනු ඇදහිල්ලට අනුව සැබෑ විමුක්තිය ඇත්තේ දේව ප්‍රේමය අත්දැකුම සහ එම ප්‍රේමය බෙදා ගැනුම තුළ බව මෙම ගීතිකාව අපූරුවට පැහැදිලි කර දේ.

ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා

# භක්ති ප්‍රබෝධනය


**2025 ජූලි - අගෝස්තු**

ප්‍රකාශනය

නිර්මල මරිය නිකාය

භාරකරු

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

සංස්කාරක

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

සංස්කරණ සහාය

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
මිල්ශානි ප්‍රනාන්දුපුල්ලේ

කවරය නිර්මාණය

අචල රූපසිංහ

පරිගණක පිටු සැකසුම

නිලුමිණ හර්ෂාන්

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 විශ්ව කතෝලික සභාවේ 267 වැනි මහා ...
ටී. සුනිල් ප්‍රනාන්දු

6 අඩ කුඹු වූ පාප් ධජය නැවතත් ලෙළ දුණි
පස්කල් ජයමාන්න

7 උපත වන්දනා ගමනකි සදාතන ජීවිතේ
කීර්ති සඳරුවන් ප්‍රනාන්දු

8 බලාපොරොත්තුවේ වන්දනාකරුවෝ
එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

11 වන්දනා ගමනකි - අයිරින් කොස්තා

12 සටන්කාමය සහ ... - සපුගස්කන්දේ රංජිත්
වන්දනා ගමනකි ජීවිතේ - දිලක්ෂි ශිරන්‍යා

13 දිළිඳුන්ගේ කුඩා සොයුරියෝ
දේශිකා ලියනගේ

14 සියලු සත්වයෝ නිදුක් වෙත්වා ! ...
ෂෙලින්ඩා සමරසිංහ

17 කෙටි කතාව - ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න

21 මනුකය ගත් දෙව් අභිමතය - රවිඳු ප්‍රසන්න

22 පවුල් දිවිය වන්දනා ගමනකි - තීක්ෂණ පෙරේරා

23 කුරුලු පවුල - දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු

24 ඕං එහෙනං - සූරිය මාමා

25 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 86
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

28 ප්‍රහේලිකා අංක 84 පිළිතුරු

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය I
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළ වන
ඉපැරණි ම සිංහල සඟරාව යි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළ වන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

ආත්මීය වන්දනා ගමනක යෙදෙන අපගේ එක් තාවකාලික නැවතුම්පොළකි මේ ජීවිතය. ස්වර්ගීය ගමනාන්තය දෙස බලා වීරියෙන් යා යුතු මේ වන්දනා ගමන, තබන හැම පියවරක් ගානේ අවදියෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ යා යුතු ගමනක් බව අප තරයේ මතක තබා ගත යුතු කරුණකි. එයට හේතුව, ගමනේ අවසානය සුන්දර වෙතත් අප යා යුතු ගමන රළු බොරළු මාවතක් ඔස්සේ කුරුසිය දරාන යා යුතුව ඇති සේ ම අප නැවතී සිටින නැවතුම්පොළ ඉතාමත් වේගයෙන් අප මනසේ ඒකාග්‍රතාව බිඳ දැමිය හැකි, යාමට ඇති ගමන ක්ෂණයෙන් අමතක කරවීමට හැකි අංගයන්ගෙන් පිරි ස්ථානයක් වීමය. ඉතින් මෙවර කවරයේ කතාව අපව අවදි කරන්නේ නොසැලෙන විශ්වාසයෙන් හා ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධව මේ කඨෝර මාවත වීරියෙන් තරණය කොට ස්වර්ගීය ගමනාන්තය වෙත ළඟාවන්නට ය.

අචල රූපසිංහ

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

**BHAKTHI PRABODHANAYA**

Rs. 850.00 for a year (Including Postage)


Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# වන්දනා ගමනක්

## හෙළිදරව්ව




අතීතයේ සිට ජනතාව තමන්ගේ ඇදහිල්ල, විශ්වාසය පෙරදැරි කර ගනිමින් පවුල් වශයෙන් පමණක් නොව කණ්ඩායම් වශයෙන් වන්දනා ගමන් ලෙස විවිධාකාර සිද්ධස්ථානවලට ඒකරාශී වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. මඩු, තලවිල, මාතර ආදී දෙව්මැඳුරු කරා සැතපුම් ගණන් දුර ගෙවා ගෙන, බර කරත්තවලින් ඇතැම් විට පා ගමනින් හලාවත, කටුනේරිය, මීගමුව, මොරටුව, මෝදර ආදී ප්‍රදේශවල සිට ජනතාව දහස් ගණනින් වන්දනා ගමන්වල නිරත වූ ආකාරය වාචික සම්ප්‍රදායේ සඳහන් වේ. ඒ කාලයේ වන්දනා ගමන් ඉතා ම අවදානම් වන අතර ගමනාගමනය ද ඉතා දුෂ්කර ය. මග දිගට භයානක වන සතුන්ට පවා මුහුණ දීමට සිදු විය. නැවත ගම්බිම් බලා එන්න ලැබෙයි ද යන්න විශ්වාසයක් තිබුණේ ද නැත. ඒත් ජනතාව එවැනි අවදානමක් දරමින් වන්දනා ගමන්වල යෙදුණේ දෙවියන් කෙරෙහි අචල විශ්වාසයක්, භක්තියක් පෙරදැරි කරගෙන ය. ඒ ඇදහිල්ල අතීතයේ සිට ම මෙවැනි වන්දනා ගමන්වලින් පිළිබිඹු විය. සාන්ත සභාව අපට උගන්වන්නේ කිතුනු ජීවිතය ඇදහිල්ලේ වන්දනා ගමනක් ලෙසට ය.

■ **පරමාර්ථය**

අද වන විට ජනතාව රට තුළ පමණක් නො වෙයි, වෙනත් රටවල විශේෂ සිද්ධස්ථාන කරා ද ගුවනින් වන්දනා ගමන්වල නිරත වෙති. ඒත් අතීතයේ වුවත් වර්තමානයේ වුවත් කවුරු කුමන ස්ථානයකට ගියත් ඒ යන හැම වන්දනා ගමනකටම පොදු සාධක කිහිපයක් ඇත.

තාවකාලික ගමනකි. නැවත ඒමට යන ගමනකි. ඒ ගමනේ දී නැවතීමට අප ස්ථිර වාසස්ථාන සොයන්නේ නැත. තාවකාලික කුඩාරමක, නවාතැන්පොළක නවාතැන් ගන්නවා පමණි. ඒ වගේම ඒ දින කිහිපය ජීවත් වන්නේ අවම පහසුකම් තුළ ය. ඒ සඳහා අප රැගෙන යන්නේ අත්‍යවශ්‍ය ම දේ පමණය. සැබෑ වන්දනාකරුවකුගේ ප්‍රධාන ම පරමාර්ථය වන්නේ ඒ ගමනින් විනෝදයක් ලබාගැනීම ට වඩා, තමන් අදහන ආගමික වත්පිළිවෙත් තුළ නිරත වෙමින් අධ්‍යාත්මික සුවයක්, සංහිඳියාවක් ලබා ගැනීම ය. ඒ වගේ ම වන්දනා ගමනක දී හමු වන පුද්ගලයන් අතර කිසිදු තරාතිරම්, උස් පහත් භේදයකින් තොරව එකමුතුකමක්, සහෝදරත්වයක් සාමාන්‍යයෙන් ගොඩ නැඟෙයි. එය නව බැඳීම් වර්ධනය කරන අවස්ථාවක් බවට ද පත් වේ. ඕනෑම වන්දනා ගමනක දී මේ පොදු ලක්ෂණ දැක ගත හැකි ය.

■ **බයිබලීය ඉගැන්වීම්**

ජීවිතය ඉතා කෙටි බව දේව වචනය අපට මතක් කර දෙයි. ශු. බයිබලයේ ගීතාවලිය

103:15-16 වගන්තිවල මෙසේ සඳහන් වේ. **"මිනිසාගේ ජීවිතය තණපත් වැනිය. ඔහු කෙතේ කුසුමක් මෙන් සරු ලෙස වැඩෙයි. එහෙත් සුළං පහර වැදී එය නැති වී යයි. එය තිබුණ තැනවත්, දක්නට නො ලැබේ"**. ඒ වගේම හෙබ්‍රෙව් 13:14 මෙලෙස සඳහන් වේ. **"සදාතන නුවරක් මිහිපිට අපට නැත. අප සොයන්නේ මතු පැමිණෙන්නට තිබෙන නුවර ය"**. මෙයින් ද පැහැදිලි වන්නේ මේ ලෝකයේ අපගේ ජීවිතය සදාකාලික නොවන බව ය. එහෙත් අපට සදාතනික නුවරක්, නව ජෙරුසලමක් නැතහොත් ස්වර්ගයක් ඇත. කිතුනුවන් ලෙස අපේ ජීවිත ගමනේ මූලික පරමාර්ථය දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වීම යි. ඒ ගමන අප මේ ලෝකයේ සිට ආරම්භ කරන අතර ඒ ගමන පූර්ණත්වයට පත් වන්නේ අපේ මරණයත් සමග යන්න අපි අදහමු.

ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප්වහන්සේ අපට මතක් කරන්නේ, අපි බලාපොරොත්තුවේ වන්දනා ගමනක නිරත වන විශ්වාසකයන් ලෙස ය. බලාපොරොත්තුව තිබෙන්නේ විශ්වාසකයන්ට පමණයි. කිතුනු අපගේ බලාපොරොත්තුව දෙවියන් වහන්සේ වතට වත දී මුණ ගැසීමයි. මංගල්‍ය ආරාධනාව යාච්ඤාවේදී අපි දේව මෑණියන්ට කන්නලව් කරමු. **"පරදේශවාසි වූ අපි ඒව අම්මාගේ පුත්‍රයෝ, ඔබටම අඬ ගසම්හ. මේ කඳුළු විලෙහි හඬා වැලපී ඔබටම සුසුම් ලම්හ..."** ජීවිතය නමැති වන්දනා ගමනේ දී අපි මුහුණ දෙන දහසක් ප්‍රශ්න, කරදර, හිත් රිදවීම් සියල්ල දරා ගෙන අපි ගමනක් යමු. ඇතැම් විට අප දෙවියන්ගෙන් ඈත් කරන ලොකුම බාධකය වන්නේත් ඒ ප්‍රශ්න, කරදර වුවත් වන්දනා ගමනක අවසානයට ළඟා වන විට අපට ඉමහත් සතුටක්, අස්වැසිල්ලක්, සැනසීමක් ලැබෙන සේ ස්වර්ගීය ජීවිතය සදා සැපත උදා කර දෙයි.

- **වන්දනා ගමනේදී කිතුනු අපේ වගකීම**

ඇදහිල්ලේ වන්දනා ගමනක නිරත වී සිටින අපගේ බලාපොරොත්තුව ස්වර්ගය යි. ඒ සඳහා අපගේ විශ්වාසය තුළ දේව වන්දනා යැදුම් පිළිවෙත් වන, දිව්‍ය පූජාව, පාපොච්චාරණය, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ආදි ප්‍රසාද නිධාන සහ භක්ති අභ්‍යාස තුළින් මේ වන්දනා ගමන සාර්ථක කර ගැනීම වැදගත් ය. ඒ තුළින් අපි දිරිමත් වෙමින්, ආධ්‍යාත්මික පෝෂණය ලබනවා සේ ම දෙවියන් වහන්සේගේ ආදරය, බලය, ආධ්‍යාත්මික සුවය අත් විඳිමු. මෙලොව ජීවිතයට මුහුණ දෙන්නට අපට ශක්තියක් ලැබේ.

ලෞකිකකරණය තුළ වුවත් ආධ්‍යාත්මික ජීවිතය සඳහා අප සූදානම් වන්නේ එවැනි ක්‍රියාකාරකම් තුළින් ය. දෙවැනි වතිකාන මන්ත්‍රණ සභාවේ දී ජාතීන්ගේ ආලෝකය නම් ප්‍රකාශනයේ 7 වැනි පරිච්ඡේදයේ 44 වැනි ලියැවිල්ලේ සඳහන් වන්නේ, "ක්‍රිස්තුන් වහන්සේගේ දෙවැනි ආගමනයේදී වන්දනා ගමනක යෙදෙන දේව ජනතාව වන අප ස්වර්ගීය සභාව හා සමඟ ඒකාබද්ධ වෙමු" යන්න යි. මෙය ඔබට මට මොනතරම් ප්‍රීති ජනක පණිවුඩයක් වන්නේ ද?

ඒ සඳහා අප ජීවත් විය යුතු ආකාරය ගැන ගීතාවලියේ 90:42 වගන්තියේ මෙලෙස සඳහන් වේ. **"දිවි පෙවෙත කොතරම් ලුහුඬුද කියා වටහා දුන මැනව. මෙය මෙනෙහි කරනු පිණිස නැණවත් සිතක් අපට දුන මැනව"**. මෙයින් අප තේරුම් ගත යුත්තේ අප දැහැමිව ජීවත් විය යුතු බව යි. බොරුවෙන්, වංචාවෙන් සහ රැවටී මෙන් කිසිවකුට පීඩාවක් නොකර සත්‍යවාදීව ජීවත් විය යුතු ය යන්න ය. ලෞකිකව දිරාපත් වන ශරීරයෙන් නිමා වුවත් කිතුනු අපගේ ආධ්‍යාත්මික ජීවිතය නිමාවට පත්වන්නේ නැත. දෙවියන් වහන්සේ සමග ස්වර්ගය නමැති සදාතනික නිවාසයේදී එක්වන බලාපොරොත්තුවේ ගමනක් අපට තිබෙන බව නිතර ම මතක් කර ගනිමු. ඒ නිසා මේ බලාපොරොත්තුවේ වන්දනා ගමනේ දී අපට දෙවියන් වහන්සේ ආරාධනා කරන්නේ ඉතා සාධාරණ ව සහ යුක්ති සහගත ව ජීවත් වෙමින් තමාගේ ජීවිතයත් ගලවා ගෙන අනුන්ගේ ජීවිතත් ගලවා ගන්නට අත හිත දෙන්නට ය. මන්ද දාවිත් රජතුමා පැවසූ අයුරින් ම පැවසීමට අපිදු භාග්‍යවන්තයෝ වෙමු.

**"සමිඳුන්ගේ නිවාසය මාගේ සදාතන වාසය වන්නේ ය"** (ගීතාවලිය 23:6 දෙවන වාක්‍යය).

**සංස්කාරක පියතුමා**

# විශ්ව කතෝලික සභාවේ 267 වැනි මහා පර්වතය අති උත්තම XIV වන ලියෝ සසුනිසුරාණෝ !

අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන්ගේ ස්වර්ගස්ථ වීමත් සමග හිස් වූ විශ්ව කතෝලික සභාවේ නව නායකයාණන් ලෙස, ඇමෙරිකා එක්සත් ජනපදයේ අති උතුම් රොබට් ප්‍රැන්සිස් කාදිනල් ප්‍රිවොස්ට් හිමිපාණන් 2025 මැයි මස 8 වන දින තේරී පත් විය.

ලොව පුරා විසිරී සිටින බිලියන 1.4ක් වූ කතෝලික ජනතාවගේ දෘශ්‍යමාන නායකයාණන් ලෙස අබිසෙස් ලද අති උත්තම XIV වන ලියෝ ශුද්ධෝත්තම පියතුමෝ සසුන් ධූරාවලියේ 267 වන සසුනිසුරාණෝ ය.

ඇමරිකා එක්සත් ජනපදයේ ඉලිනොයිස් ප්‍රදේශයේ චිකාගෝ නුවර දී ස්පාඤ්ඤ සහ ඉතාලි සම්භවයක් ඇති දෙමව්පියන්ට දාව 1955 සැප්තැම්බර් මස 14 වන දින උපන් රොබට් ප්‍රැන්සිස් ප්‍රිවොස්ට් දරුවා, වැඩිමහල් සහෝදරයින් දෙදෙනෙකුගෙන් යුතු පවුලේ බාලයා විය. ඇමරිකාවේ චිකාගෝ නුවර සාමාන්‍ය පාසැලකින් ප්‍රාථමික අධ්‍යාපනය ලද මේ දරුවා, 1973 වසරේ දී සාන්ත අගුස්තීනු නිකායට අයත් කනිටු දෙව්සත්හලට ඇතුළු ව සිය ද්විතීයික අධ්‍යාපනය හමාර කළේ ය. පසු ව එම නිකායේ ම පූජක සිසුවකු ලෙස දෙව්දහම හදාරා 1981 අගෝස්තු මස, අගුස්තීනු නිකායේ පැවිදිවරයකු ලෙස සදාකාලික වේද පොරොන්දු ලබා දුන්නේ ය. 1982 වසරේ දී චිකාගෝ නුවර කතෝලික දේවධර්ම සංගමයෙන් දේවධර්මය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද දිනාගත්තේ ය. පසුව ගණිතය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද හිමි කරගෙන සිය අධ්‍යාපනික කටයුතු අවසන් කරන එතුමෝ



1982 ජූනි මස 12 වන දින රෝමයේ දී පූජක වරම් ලබා ගත්තේ ය.

පියතුමකු ලෙස සිය අධ්‍යාපනික සහ ශාස්ත්‍රීය දැනුම පුළුල් කර ගැනීමට අදිටන් කරගත් ගරු රොබට් ප්‍රැන්සිස් ප්‍රිවොස්ට් පියතුමා 1984 වසරේ දී සභා නීතිය පිළිබඳ උපාධියක් ද ලබා පසුව තෝමස් ඇක්වයිනාස් උසස් විද්‍යාලයෙන් සභා නීතිය පිළිබඳ ආචාර්ය උපාධිය ද හිමිකර ගත්තේ ය. අධ්‍යාපනයෙන් බොහෝ කඩයිම් ජයගත් පසුව සිය උපන් රටට පැමිණ ධර්මදූත සේවාව ආරම්භ කළේ, ලතින් ඇමරිකාවේ පේරු රාජ්‍යයේ අගුස්තීනු ධර්මදූතයෙකු ලෙස ය. පේරු රාජ්‍යයේ සාමාන්‍ය සහ ගෝත්‍රික ජනතාව අතර වාසය

කරමින් ඉතාමත් දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල ඇවිද යමින් ජනතාවගේ දුක්ගැනවිලිවලට සවන් දුන් මෙතුමා දුගීන්ට පීඩිතයින්ට සැබෑ එඬේරෙක් විය.

පසුව සිය අගුස්තීනු නිකාය විසින් එතුමන් ආපසු කැඳවා පේරු රාජ්‍යයේ ශුද්ධ වූ අගුස්තීනු ජාතික දෙව්සත්හලේ සභා නීතිය පිළිබඳ මහාචාර්ය පදවිය හා එහි අධ්‍යාපන පීඨාධිපති ලෙස ද පත් කළේ ය. සාන්ත සභාව තුළ ඉතා දිගු ගමනක ඉඟි පෙන් වූ ගරු ප්‍රිවොස්ට් පියතුමන්, 2001 වසරේ දී අගුස්තීනු නිකායේ ශ්‍රේෂ්ඨාධිපති පියතුමන් ලෙස ද පත්වීම් ලැබී ය.

2014 දෙසැම්බර් මස 12 වන දින ඇමරිකාවේ චික්ලායෝ සාන්ත මරියා ආසන දෙව්මැඳුරේ දී ගරු ප්‍රිවොස්ට් පියතුමන් චික්ලායෝහි රදගුරුතුමන් ලෙස අභිෂේක ලැබී ය. පසුව මෙතුමාණන් හට වතිකානුවේ වැදගත් තනතුරු කිහිපයක් හිමි විය.

2023 ජනවාරි 23 වන දා අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා විසින් මෙතුමන්ව, රදගුරු හිමිවරුන් පිළිබඳ අපෝස්තලික කොමිසමේ අධිපති ධූරයට පත් කෙරුණේ, අගරදගුරුවරයට ද ඔසොවාලමිනි. 2023 සැප්තැම්බර් 30 වන දා සසුන් පියාණන් විසින් මෙතුමා ව කාදිනල්වරයෙන් පුදනු ලැබී ය.

ඇමරිකා එක්සත් ජනපදයෙන් බිහි වූ පළමු සසුනිසුරාණන් මෙන් ම, අගුස්තීනු නිකායෙන් බිහි වූ ප්‍රථම පාප්තුමන් ලෙසට ද ඉතිහාසගත වන අති උත්තම දාහතරවන ලියෝ ශුද්ධෝත්තම පියාණන්ට තවත් දශක ගණනාවක් පුරා විශ්ව කතෝලික සභාව මෙහෙය වන්නට දේවාශිර්වාදය නො අඩුව ලැබේවා යි 'භක්ති ප්‍රබෝධනයේ' ප්‍රාර්ථනය යි.

**සටහන - ටී. සුනිල් ප්‍රනාන්දු**

# අඩ කුඹු වූ පාප් ධජය නැවතත් ලෙළ දුණී

සුදතුම් ෆ්‍රැන්සිස් පියාව සැමගේ හදවතේ සිටී
දුරස් නොවෙයි දෙව් අභිමතයට වුව දිවි ගමන කෙටී
සරල ගතිය තුළ රැඳෙමින් මතකයි දිවි ගෙවූ හැටී
ආදර කරුණාව ලොවේ හැම දෙයට ම වඩා වටී

අසරණයින් දුගියන් සමගින් මග නිරතුරුව ගෙවා
කැප වූ බැටළුවන් සැම විපතින් කරගන්න මුවා
ඔවුන් විඳින දුක දැමුව බව දන්නා කමට නිවා
පාප් ධජය අඩකුඹු විය පොඩි පැල්පත්වලද පවා

සමුගැන්මෙන් පසුවට අප මෙහි වන්නට නොදී තනී
නව බැටළු එඬේරෙක්ව පිය දෙවිඳුන් අපට දුනී
ලියෝ පාප් වහන්සේ ය අපගේ දහහතර වැනී
කළ සේවය පීරු රටේ දී හොඳ හැටි සැවොම දනී

එඬේරෙකු මිතුරෙකු සොහොයුරෙකු ලෙසින් තබන දෙපා
බලාපොරොත්තුව පීඩිතයින්ගේ දුක විඳින අපා
වෙනුවෙන් ලෙළ දුණි නැවතත් පාප් ධජය සිනා පපා
වචන රූප යුද්ධ නැවත මිහිපිට ඇති වෙන්න එපා

බැටළු එඬේරාණන් සමුගෙන ගිය පුද කෙරුව පෙම
දුටු දෙයකි හදවතින් ම මෙහි වෙසෙනා දෙන ම සැම
දුක් විඳිනා ජනතාවට එම සහනය නොවන නිම
හිමිවන්නට පසු දිනයෙම නැඟුණි සුදු පැහැති දුම

සුදතුම් ෆ්‍රැන්සිස් පිය සඳ මෙලොව ගෙවූ ජීවිතය
සසුන් කෙත සුරකින්නට තියෙන එකම මාවතය
සසුනි සුරාණන් හට නව නුපුරුදු නැති දෙයකි එය
දෙවිඳුන් උන් වහන්සේව දුන්නේ ඒ නිසාමය

**පස්කල් ජයමාන්න**
**උස්වැටකෙයියාව.**

# උපත වන්දනා ගමනකි සදාතන ජීවිතේ...

මා ඔබගෙන් ලද උතුම් ම තිළිණය,
උපතයි මෙලොවට වන්දනා ගමනකට...
අපැහැදිලි, දුෂ්කර මාවත්,
එළි පෙහෙළි කර ගනිමින්,
පාර තනාගෙන එන්නම් ඔබ සොයා මං...
ගමනේ නිමාව නොපෙනුනත් දෑසට,
දකිමි මාව රැගෙන යන බව,
ඒ නැවතුම කරා ඔබ...
හිත තුළ ඇත්තේ ඔබ ගැන,
නොමියෙන විශ්වාසයයි සැමදා...
හද පතුලේ ඇති බලාපොරොත්තුව,
ඔබ වත දැක ගන්නයි මා දෑසට...
කාගෙන්වත් නොලැබිය හැකි ආදරය,
ලබන්නේ ඔබෙන් පමණයි මම...
යන්නට දිළිඳු ජනයා වෙත ඔබ දුන් දෙපයින්,
දකිනට ඔවුන්ගේ වේදනාව මා ලද දෑසින්,
පිසලන්නට ඔවුන් හෙළන කඳුලු මට දුන් දෑතින්,
දෙන්නට සැනසුම් වදනක් ඔබෙන් ලද මුවින්,
වන්නට ඔවුනට ඔබ වැන්නෙක් මා මුළු දිවියෙන්,
අවැසි එය කරන්නටයි,
යන්නට කලියෙන් හුස්ම මා හදෙන්...
හැකි වේවි එවිට මට,
අවසන් කරනට මේ ගමන,
අරඹන්නට නව දිවියක්,
රැඳී ඔබ තුරුලේ...



**"මහෝත්තම දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය මා කෙරෙහි ය. දිළිඳුන්ට සුබ අස්න දෙසීමට ද, බිඳුණු සිත් ඇත්තන්ට සුව සෙත දීමට ද, වහලුන්ට මිදීම දානය කරන්නට ද, සිරකරුවන්ට නිදහස දක්වන්නට ද, එතුමාණෝ මා ආලේප කළ සේක. සමිඳුන්ගේ කරුණාවේ දවස, සතුරන්ට දඬුවම් දීමේ දවස, පළ කරන පිණිස ද, වැළපෙන සියල්ලන් සනසන පිණිස, එතුමාණෝ මා ආලේප කළ සේක"** (යෙසායා 61:1-2).

දිළිඳු දනට සුබ අස්න දෙසන්නට, බිඳුණු සිත් ඇත්තන් සුව කරන්නට, වහලුන් හා සිරකරුවන් මුදන්නට සමිඳාණෝ ඔබව මාව ආලේප කර ඇත. ඒ උන් වහන්සේගේ කරුණාව, දයාව, ආදරය තුළ වැළපෙන දනට සහනයක් වන්නට ය. අපගේ ජීවිතය වන්දනා ගමනකි. මෙලොව විපත සදාතන ජීවිතයේ ඇරඹුමකි. නිදහස් කැමැත්තට අනුකූලව අප ඇරඹූ වන්දනා ගමන සමිඳුන්ට ප්‍රසන්නව, උන් වහන්සේගේ සැලැස්මට අනුව ගෙවීම ඔබගේ මගේ යුතුකමකි. වගකීමකි.

**කීර්ති සඳරුවන් ප්‍රනාන්දු**
**දිව්‍ය හෘදයේ නි. ම. නි. ආධුනිකාරාමය,**
**සිඳුපියනිල, බණ්ඩාරවෙල.**

# බලාපොරොත්තුවේ වන්දනාකරුවෝ

ක්‍රි. ව. 2025 ජුබිලි වර්ෂයක් ලෙස ප්‍රකාශ කරමින් "බලාපොරොත්තුවේ වන්දනාකරුවන්" වීමට ස්වර්ගස්ථ වූ ෆ්‍රැන්සිස් විශ්ව එඩේරාණෝ සියලු කතෝලික ජනතාවට ආරාධනා කළහ. මේ තේමාව කිතුනු ජීවිතයේ හදවත බව අමුතුවෙන් කිව යුතු නොවේ.

- බලාපොරොත්තුව

තමන් ප්‍රාර්ථනා කරන අභිලාෂය හෝ ඉලක්කය සිදුවනවා යන්න කෙනෙක් ආශාවෙන් බලාගෙන සිටීම බලාපොරොත්තුව ලෙස විග්‍රහ කර ගත හැකි ය. අනාගතයේ දී කුමන ප්‍රතිඵලයක් ගෙන ඒවිදෝ යන්න නිශ්චිතව ම නො දැන සිටිය ද "යහපත් දේ ඉටුවේවා" යැයි පැතූ පැතුම මල් ඵල ගැන්වෙන තුරු අපේක්ෂාවෙන් සිටීම බලාපොරොත්තුවේ ස්වභාවය යි.

එදිනෙදා ජීවිතයේ දී අපි බලාපොරොත්තු වන දේ ඒ ආකාරයෙන් ම හැම විට ම හැම තැන ම ඉෂ්ට සිද්ධ නො වන බව අපි අත්දැකීමෙන් දනිමු. එවිට අප අධෛර්යයට පත් ව වේදනාවක් සමග කලකිරීමක් ද ඇතැම් විට ඇති විය හැකි ය.

එහෙත් කිතුනු ඇදහිල්ල තුළ අප ඇති කර ගන්නා "බලාපොරොත්තුව" අපව ලෝකෝත්තර තලයකට ගෙන යයි.

"ක්‍රිස්තුන් වහන්සේගේ පොරොන්දු මත අපගේ විශ්වාසය තබමින්, අපගේ ශක්තිය මත නොව ශුද්ධාත්මයාණන් වහන්සේගේ වරප්‍රසාදවල උපකාරය මත යැපෙමින්, ස්වර්ග රාජ්‍යය හා සදාතන ජීවිතය අපගේ සතුට ලෙස පතන්නේ බලාපොරොත්තුව නමැති දේව ධර්ම ගුණය මගිනි" (කතෝලික සභා ධර්මෝපදේශය, අංක 1817).

**"පොරොන්දුව දුන් තැනැන් වහන්සේ විශ්වාසවන්ත බැවින් අප පිළිගත් බලාපොරොත්තුවෙහි නොසෙල්වී, ස්ථිර ව පිහිටා සිටිමු"** (හෙබ්‍රෙව් 10:23).

- අපගේ බලාපොරොත්තුවේ පදනම

ප්‍රසාද ස්නාපනය ලබන්නට යන අපේක්ෂකයාගෙන් පූජාප්‍රසාදීතුමා මෙලෙස අසයි. "ඔබ දෙවියන් වහන්සේගේ සභාවෙන් ඉල්ලා සිටින්නේ කුමක් ද?" "ඔහු හෝ ඇය ප්‍රකාශ කරන්නේ විශ්වාසය යි" යනුවෙනි. අනතුරුව පූජාප්‍රසාදීතුමා අසන්නේ "විශ්වාසයෙන් ඔබට ලැබෙන්නේ කුමක් ද?" අපේක්ෂකයා "සදාතන ජීවිතය" යි පිළිතුර ලෙස පවසයි. ඒ අනුව කිතුනු බලාපොරොතුවේ අත්‍යාවශ්‍ය පදනම සදාතන ජීවිතය යි. කිතුනු ජීවිතයේ හදවත බඳු, සදහටම පවතින දේව ධර්ම ගුණ තුනකි. **ඇදහිල්ල, බලාපොරොත්තුව සහ ප්‍රේමය** (1 කොරින්ති 13:13).

ඒ අනුව "බලාපොරොත්තුව" යනු අපගේ ජීවිත පරමාර්ථය සාක්ෂාත් කරන, "සදාකල් ජීවනය" සඳහා නො නවතින ආශාවක් ඇති කරන, ඇදහිලිවන්තයා අපේක්ෂා කරන දේව ධාර්මීය ගුණයකි. අපගේ මෙලොව ජීවිතය නිමා වන විට ඉන් ඔබ්බට අපට ජේසුස් වහන්සේ සමග සදාකාල ජීවනය හමු වනු ඇත. එනම් දෙවියන් වහන්සේ සමග පූර්ණ සහයෝගීතාවයෙන් යුතුව උන් වහන්සේගේ අසීමිත ප්‍රේමය බෙදා ගැනීම යි.

ශුද්ධ වූ අගුස්තීනු තුමා මෙලෙස පවසයි. "මගේ මුළු පැවැත්ම තුළ ම මම ඔබ හා එක් වූ විට තවදුරටත් වේදනාවක්, සහ වෙහෙසක් නො වනු ඇත. මාගේ ජීවිතය සැබෑ ජීවිතයක් වනු ඇත, ඔබගෙන් සම්පූර්ණයෙන් පිරුණු ජීවිතයක් වනු ඇත."

මින් අදහස් කරන්නේ ජීවිතයේ සම්පූර්ණ සංතෘප්තිය ඇත්තේ දෙවියන් වහන්සේ තුළ පමණක් බව යි.

ඇදහිල්ල තුළ පැවතෙමින් අප තබන බලාපොරොත්තුව කිසිදා අපව අපහසුතාවයකට පත් නො කරන වග ශු. පාවුලු තුමා පවසයි.

"ඇදහිල්ලෙන් අපට ලැබී ඇති මේ දේව වරප්‍රසාදයට පිවිසෙන මඟ අපට සලසා දුන්නේ ක්‍රිස්තුන් වහන්සේ ය. ඒ නිසා අපට හිමි වන්නට යන දේව මහිමයේ බලාපොරොත්තු ගැන අපි අතිශයින් ප්‍රීති ප්‍රමෝද වෙමු. එපමණක් නොව පීඩා විඳීමෙන් ඉවසිල්ල ද, ඉවසිල්ලෙන් තැන්පත් බව ද, තැන්පත් බවෙන් බලාපොරොත්තුව ද උපදින බව දැන අප විඳින පීඩාවල දී වුව ද, අපි ප්‍රීති ප්‍රමෝද වෙමු. එබඳු බලාපොරොත්තුවකින් කිසිම කලකිරීමක් ඇති නො වෙයි. මන්ද, අපට දෙන ලද ශුද්ධාත්මයාණෝ දේව ප්‍රේමයෙන් අප සිත් පුරවන සේක" (රෝම 5:2-5).

ඒ අනුව බලාපොරොත්තුව යනු ඇදහිලිවන්තයන්ගේ ආධ්‍යාත්මික ජීවිතයට පහන් ටැඹක් සේ මඟ පෙන්වන, අරමුණ සහ ඉලක්කය ලබා දෙන ධර්ම ගුණය යි. ඒ නිසා ම ශු. පාවුලුතුමා අපව දිරි ගන්වයි.

**"බලාපොරොත්තුවෙහි ප්‍රීති වන්න, විපතේ දී ඉවසිලිවන්ත වන්න, යාච්ඤාවෙහි නොකඩවා යෙදෙන්න"** (රෝම 12:12).

ඇදහිල්ල තුළ පිහිටුවන කිතුනුවාට ක්‍රිස්තුන් වහන්සේ හැර වෙන කෙනෙක් සිටී ද?

අපගේ ඇදහිල්ලට අනුව මේ විශ්වය පහව ගොස් අලුත් අහසක්, අලුත් පොළොවක් දෙවියන් වහන්සේ විසින් ලබා දෙන බව බලාපොරොත්තුවෙන් සිටින ජනතාවකි අප.

**"ධර්මිෂ්ඨකමට වාස භූමිය වූ නව අහසක් ද, නව පොළොවක් ද දෙවියන් වහන්සේ අපට පොරොන්දු වී ඇත. අපි එය බලාපොරොත්තුවෙන් සිටිමු"** (2 පේදුරු 3:13).

කිතුනු ජනතාව ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනය බලාපොරොත්තු වෙති. ක්‍රිස්තුන් වහන්සේ පොදු විනිශ්චය සඳහා යුගාන්තයේ දී අප අතරට වඩිනා බව දේව වචනය අනාවරණය කරයි (මතෙව් 25:31-46).

කෙසේ වෙතත් ලැබූ බලාපොරොත්තුවේ ගුණයෙන්, මනුෂ්‍යාත්වයේ ඉතිහාසය සහ අපගේ ම පුද්ගලික ඉතිහාසය අවසානයකට හෝ අඳුරු ආගාධයකට ඇද නොවැටේ. ඒ වෙනුවට, කාලයාගේ ඇවෑමෙන් සමිඳාණන් වහන්සේ නිසැකවම හමුවන බවට බලාපොරොත්තුව විසින් සහතිකයක් දෙයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපි උන් වහන්සේගේ නැවත පැමිණීම අපේක්ෂාවෙන් සහ ක්‍රිස්තුන් වහන්සේ තුළ සදහටම ජීවත් වීමේ බලාපොරොත්තුවෙන් ජීවිතය ගත කරමු.

**"ජේසුස් ස්වාමින් වහන්ස වැඩිය මැනව !"** (එළිදරව්ව 22:20)

මුල් කිතුනුවන්ගේ මේ හෘදයංගම යැදුම අපි අපගේ ම කර ගනිමු ද ?

ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය සහ උත්ථානය අපගේ ඇදහිල්ලේ කේන්ද්‍රය සහ බලාපොරොත්තුවේ පදනම යි.

ක්‍රිස්තුන් වහන්සේගේ භාග්‍යය අට ප්‍රකාශ කිරීමේ දේශනාවත් සමඟ නව පොරොන්දු දේශය වන ස්වර්ගය වෙතට අපගේ බලාපොරොත්තු ඔසවයි. මේ දේශනාවේ අඩංගු භාග්‍යයන් වනාහි ක්‍රිස්තු අනුගාමිකයන් වැටීමට හැකි විවිධ පරික්ෂාවලට මුහුණ දීමට මඟ පෙන්වන බලාපොරොත්තුවේ දිශානතිය පෙන්වන පහන් ටැඹ යි. ක්‍රිස්තුන් වහන්සේ අපට පෙර දුක් විඳ අපව ගලවා ගෙන ඇති නිසා ම උන් වහන්සේ අප උදෙසා පෙර ගමන්කරුවකු ලෙස අප අතරට වඩින සේක.

බලාපොරොත්තුව ප්‍රකාශ කරන්නේත් එය පෝෂණය කරන්නේත් යාච්ඤාව තුළ ය. විශේෂයෙන් 'බලාපොරොත්තුව' වෙතට අප යොමු කරන ප්‍රාර්ථනා සහ යැදුම් සියල්ලේ සාරාංශය ස්වාමිවාක් ආරාධනාව තුළ ගැබ් වී ඇත (ක. ස. ධ. අංක 1820).

කුරුස පාමුල සියල්ල සිත්හි නිදන් කරගෙන ඉවසීමෙන්, උපේක්ෂාවෙන් සිටි මරිය අම්මා, සැබැවින්ම වික්ෂෝප දේව මෑණියන් ලෙස හඳුන්වා ගැනීමට වඩා උචිත වනුයේ

බලාපොරොත්තුවේ අම්මා ලෙස හඳුනා ගැනීම ය. අභියෝග සියල්ල තුළ වුවද ක්‍රිස්තුන් වහන්සේගේ පළමු පෙළේ ගෝලයින් එකමුතු කරගෙන ඔවුන් සමඟ එතුමිය යාච්ඤාවේ නිරත වූයේ බලාපොරොත්තුවේ ගුණය නිසා ය. එතුමියගේ බලාපොරොත්තුවේ දේව ධාර්මීය ගුණය අපට ද පූර්ව ආදර්ශයක් වනු ඇත [(ජොහාන් 19:25-27) (ක්‍රියා 1:14)].

දෙවන වතිකානු මන්ත්‍රණ සභාව බලාපොරොත්තුව ගැන මෙසේ පවසයි. "මිනිසුන්ට දෙවියන් වහන්සේ ගැන විශ්වාසය නැති වී දිව්‍යමය ආධාරය අහිමි වූ විට, සදාකාල ජීවිතය පිළිබඳ බලාපොරොත්තුව ශුන්‍ය වී ජීවිතයට ගෞරව කිරීමේ වුවමනාව පවා හීන වේ. ජීවිතය සහ මරණය, පාපය සහ දුක් වේදනා පිළිබඳ ගැටලු නො විසඳී පවතින විට මිනිසුන් නිරන්තරයෙන් බලාපොරොත්තු සුන් වීමට ඇද දමනු ඇත" (Pastoral Constitution on the Church in the Modern World - Article No:21).

- වන්දනාකරුවෝ

තම ආගමික විශ්වාසයන් සහ පිළිවෙත් බැතිමත් ලෙස ඉෂ්ඨ සිද්ධ කර ගෙන සංහිඳියාවක් ලබා ගැනීම සඳහා පිරිසක් අවතීර්ණ වන පූජනීය ගමනක් වන්දනා ගමනක් ලෙස අර්ථ දැක්විය හැකි ය. වන්දනා ගමනකට පොදු ලක්ෂණ කීපයක් ඇත.

- දුර බැහැර ස්ථානයකට වන්දනා ගමන යන්නට වන්දනාකරුවන් බොහෝ විට පෙළඹේ.
- කාලය කෙටි ය. දිනක් හෝ දින කීපයකට සීමා වේ. එබැවින් තාවකාලික ය.
- ස්ථිර වාසස්ථාන නො සාදති. එබැවින් ආහාර පාන, ඇඳුම් පැළඳුම් ඇතුළු අත්‍යාවශ්‍යය දේ පමණක් රැගෙන යති.
- ආධ්‍යාත්මික සුවයක් ලබා ගැනීම එහි පරමාර්ථය යි.
- එකිනෙකා අතර, එකමුතුකම, සහෝදරත්වය සහ බැඳීම වර්ධනය කර ගත හැකි අවස්ථාවකි.

සභා මාතාව අපගේ මෙලොව ජීවිතය වන්දනා ගමනක් බව නිරන්තරයෙන් පවසන්නී ය. වන්දනා ගමනක ස්වරූපය ගන්නා ක්‍රිස්තු අනුගාමිකයන්ගේ මෙලොව ජීවිතයේ අවසාන ඉලක්කය සදාතන ජීවිතය යි. ස්වර්ගය යි. නව ජෙරුසලම යි.

'වන්දනා ගමනක්' තාවකාලික ය යන්න ඉහතින් පැවසිණි. වන්දනා ගමනක් කෙටි සේ ම අපගේ මෙලොව ජීවිතයත් කෙටිය යන්න දේව වචනය මතු කරයි.

"මවු කුසින් උපන් හැම කෙනෙකුගේ ම ජීවිත කෙටි ය. දුකින් පිරී ඇත. ඔහු මලක් මෙන් පිපී, පරවී යන්නේ ය. නො පවතින සෙවණැල්ලක් මෙන් පහව යන්නේ ය" (ජෝබ් 14:1-2)

වන්දනා ගමන නමැති කිතුනු ජීවිතය ගත කරන වන්දනාකරුවන්ගේ එකම බලාපොරොත්තුව සදාතන ජීවිතය යි. නව ජෙරුසලම හෙවත් ස්වර්ගයට පියමං කිරීම යි.

"සදාතන නුවරක් මිහිපිට අපට නැත. අප සොයන්නේ මතු පැමිණෙන්නට තිබෙන නුවර ය" (1 හෙබ්‍රෙව් 13:14).

මළවුන් අරභයා සිදු කෙරෙන දිව්‍ය පූජාවේ ප්‍රශංසා ගී අංක 1 හි මෙසේ සඳහන් වේ.

"ස්වාමිනී, ඔබ වහන්සේගේ විශ්වාසකයන්ගේ ජීවිත වෙනස්වනු මිස කෙළවරට නො පැමිණෙන්නේ ය. ඔවුන්ගේ මෙලෝ වාස භවනය ජරාපත් වූ විට ඔවුන්ට ස්වර්ගයේ සදාතන වාසස්ථානයක් පිළියෙල කරනු ලබන්නේ ය."

මේ ලෝකයට අප සැබැවින්ම අයත් නැති බව ප්‍රකාශ වන බයිබලීය පණිවුඩයක් අප එදිනෙදා උච්චාරණය කරන මංගල්‍යස්තු යාච්ඤාවේ ද ඇත.

"පරදේශවාසි වූ අපි ඒවා අම්මගේ පුත්‍රයෝ ඔබටම අඬ ගසම්හ..."

දෙවන වතිකාන කතිකාවතේ ශු. සභාව පිළිබඳ ව්‍යවස්ථාවේ (LUMEN GENTIUM - ජාතීන්ගේ ආලෝකය) හත්වන පරිච්ඡේදය මෙසේ පවසයි. "ලෝකාන්තයේ දී එනම් ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයේ දී වන්දනා ගමනක යෙදෙන දේව ජනතාව වන අපි ස්වර්ගීය සභාව හා සමඟ ඒකාබද්ධ වෙමු" (අංක 48 වන ලියවිල්ල).

"දෙවියන් වහන්සේගේ ඒ අභිප්‍රාය නම්, නියමිත කාලයේ දී ස්වර්ගයෙහි ද, පොළොවෙහි ද එනම් මුළු විශ්වයෙහි ඇති සියල්ල, ක්‍රිස්තුන් වහන්සේගේ යටතෙහි එක්සත් කිරීම ය" (එපීස 1:10).

එබැවින් විදේශයක වන්දනා ගමනක යෙදෙන ශු. සභාව ලෝකයේ පීඩා අතරින් සමිඳුන්ගේ සැනසීම මැද ඉදිරියට යමින් ස්වාමීන් වහන්සේ වඩින තුරු උන් වහන්සේගේ දුක් විඳීම, කුරුසියේ මරණය හා විරාජමාන උත්ථානය ප්‍රකාශ කරයි (1 කොරින්ති 11:26). ඒ නිසා සභාවේ මෙම වන්දනා ගමන ඇඳහිල්ලේ වන්දනා ගමනකි. උත්ථාන වූ සමිඳුන්ගේ බලයෙන් යන වන්දනා ගමනකි. ශුද්ධාත්මයාණන් තුළ වන්දනා ගමනකි. ඒ අනුව සෑම කිතුනු අනුගාමිකයෙක් ම මෙම වන්දනා ගමනේ නඩයට අයත් ය. වන්දනාකරුවෝ වන්දනා ස්ථානයට ළඟාවන තුරු නො ඉවසිල්ලෙන් බලා සිටිති. එසේ ම අපිදු, උන් වහන්සේගේ දෙවන පැමිණීම අපේක්ෂා කරන කිතුනු වන්දනාකරුවන් වශයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ ධර්ම දේශනාවල පණිවුඩයට අනුව ජීවත් විය යුතු ය.

"ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය මිස මට, ස්වාමිනී, ස්වාමිනී යි කියන සියල්ලෝ ම ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නෝ ය" (මතෙව් 7:21).

කතෝලික සභා මාතාව සාංඝික සහ සංගමනශීලි ගමනක් යාමට සියලු ක්‍රිස්තු අනුගාමිකයන්ට ආරාධනා කරන්නී ය. ස්වර්ගස්ථ වූ අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණෝ කිතුනුවන් එකට එක්ව ගමන් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරති. දේව දරුවන් ලෙස අප එකට එකතුවීම සහ එකමුතුකම පෙරදැරි කරගෙන එකට එක්ව ගමන් කිරීමේ අවශ්‍යතාවය උන් වහන්සේ පුන පුනා පවසයි. එබැවින් "බලාපොරොත්තුවේ වන්දනාකරුවෝ" වන සියලුම විශ්වාසයේ සැදැහැවත් ජනතාවට දිනක නව ජෙරුසලම වන ස්වර්ගයට සම්ප්‍රාප්ත වීමේ භාග්‍යය ලැබේවා යයි ප්‍රාර්ථනා කරමු.

**එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා**

## වන්දනා ගමනකි

මිහිතල වන්දනා ගමන නිම කරමින්නේ
සසුන් පියා සුර විමනෙහි සැප ලැබගන්නේ
මරිය මවුන් සළු සෙවණෙහි පහස ලබන්නේ
ඒ වෙනුවෙන් අපි දෙව්පිය නිති පසසන්නේ

දරු කැළ වෙත ලස්සන ලෝකයක් තනන්න
ජීවිත වන්දනා ගමන නිසි ලෙස යන්න
දෙව් පෙම තුළ සුදුසබයට පණ ලැබ දුන්න
ණය ගැති වෙමු සසුන් පියේ අප සැම නිතින

බැටළු පැටව් සරු තණබිම් වෙත ගෙනයන්න
මිහිපිට අවසන සැමහට දෙවිඳු දකින්න
ඇද නැති මාවත් සදමින් ගමනක් යන්න
දේව පියේ නවමු එඬේරාණන් බලයෙන් පුරවන්න

වන්දනා ගමන සගලොවෙන් ම කෙළවර වේවා
සුදත් සුරිඳු බලයෙන් අප නිතින පිරේවා
වචනය තුළ නිතරම දෙවිඳුන් හමු වේවා
සුසුදු පූපෙ වසන ජේසු ජීවිත සැනසුම ගෙන දේවා

**අයිරින් කොස්තා**
**කඳවල.**

# සටන්කාමය සහ යුක්තිගරුක බව

අයිතීන් දිනා ගැනීම සඳහා සටන් කිරීමට වෘත්තියෝ හුරු වී සිටිති. විශේෂයෙන්ම ඒ රාජ්‍ය සේවකයෝ ය. පෞද්ගලික අංශයේ සේවකයන්ට එම හැකියාව අවම ය; විශ්‍රාම වැටුප් ද අහිමි ය.

තම ප්‍රජාවට පමණක් හිමි වරප්‍රසාද රැක ගැනීමටත්, උපරිම කර ගැනීමටත් අපි සටන් කරමු. අපට හිමි වරදාන වරප්‍රසාද ඒවා අහිමි අයටත් හිමි වෙනවාට අපි අකැමැත්තෙමු. ජාතිවාදීන්ගේ හා ආගම්වාදීන්ගේ බොහෝ උද්ඝෝෂණ එවැනි ය. මර්දනය දැඩි නො කර, පාලකයන්ට තම පාලනය කරගෙන යා නොහැක. චීනයෙහි සිසු අරගල නැති කළේ එලෙස ය.

යුක්තිය ඉටු කරවාගත හැක්කේ සටන් මඟින් පමණක් බව එක්තරා ජනප්‍රිය මතවාදයකි. එම මතය අනුව යමින්, ඇතැම් සටන් අතීතයේ දී ලෝකයෙහි ජය ගෙන තිබේ. එහෙත් අතීතයට වඩා අද ලෝකය ශිෂ්ට ය.

යල්පැන ගිය එම මතවාදය අනුව යෑම නිසා, 71 දී සහ 88/9 දී දකුණේත් තිස්වසරක යුද්ධය තුළ උතුරෙත් විශාල ජීවිත නාස්තියක් සිදු විය. තරුණයෝ වධ බන්ධනයට ලක් වූහ. ත්‍රස්තවාදය මැඩලීම සඳහා ජාත්‍යන්තරයත් වර්තමානයෙහි ඕනෑම රටකට සහය දෙයි. යුක්තිය ඉටු විය යුතු ය. එහෙත් සටනක දී ජය ගනු ලබන්නේ යුක්තිය නොව ශක්තිය වේ.

වැඩ මැරීම්, පොදු දේපළ විනාශ කිරීම්, සහ ප්‍රචණ්ඩ අරගල පොදු ජනතාවට අතිශයින් පීඩාකාරී ය; රටේ ආර්ථිකයට ඉතා හානිකර ය; සාමකාමී වටාපිටාවට අහිතකර ය. යුක්තිය ඉටු වීම සඳහා, සටන වෙනුවට, මානුෂික සහ ප්‍රඥාගෝචර වූ වෙනත් විකල්ප නැද්ද?

රටේ ව්‍යවස්ථාව මඟින් මානව හිමිකම් ශක්තිමත් කර ඇති රටවල සටන් අවම ය. එපමණක් නොව, ඒවායෙහි දූෂණ සහ අපරාධත් අවම ය; ආර්ථිකයන් සෞභාග්‍යමත් ය. පොලීසිය මානවහිතෛෂී ය; හිර ගෙවල් වැසෙමින් පවතී. උතුරු යුරෝපීය රටවල් ඊට නිදසුන් ය. ජනතාව බලපෑම් කළ යුත්තේ ව්‍යවස්ථාවෙහි මානව හිමිකම් ශක්තිමත් කරවා ගැනීමට නොවේ ද?

එහෙත් අප ඇබ්බැහි වී ඇත්තේ තම තමන්ගේ ප්‍රජාවන්ට අයත් ගැටළු පමණක් විසඳවා ගැනීම සඳහා, මැතිවරණයන්ට පෙර, දේශපාලන පක්ෂවලින් පොරොන්දු ලබා ගැනීමට ය.

**සපුගස්කන්දේ රංජිත්**

# චන්දනා ගමනකි ජීවිතේ...

| | |
|---|---|
| දිවියේ ඇත නොයෙකුත් චන්දනා | ගමන් |
| එනමුදු අප හැමටම ඇත්තේ එක් | ගමනකි |
| එය නම් සව් බල දෙවිඳුන් සොයා | යන |
| සග ලොව කරා යාමට ඇති ගමන | යි |
| දිවියේ නොයෙකුත් බාධක | හමුවේ |
| පහසු නොවේ සග ලොව | ගමන |
| විවිධ ප්‍රශ්න ගැටලු | හමුවේ |
| නොසැලී දිරියෙන් යා යුතු | වේ |
| දිරියෙන් යන විට නොසැලී | පෙරටම |
| ලුසිෆරයන්ගේ සේනාවන් | මගිනේ |
| නෙක විධ දිවියේ ලණු | ඇද |
| පාප මඟට අප යොමු කර | වන්නේ |
| දිවියේ ජය පැරදුම් | හමුවේ |
| නැගිට දිරියෙන් යා යුතු | වේ |
| වැටිල ම සිටියොත් දිවි | ගමනේ |
| නැත ගමනක් සුර ලොව | වෙතිනේ |

**දිලක්ෂි ශිරන්‍යා රුදිගු**
**10 ශ්‍රේණිය**
**ශා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ - 07.**

# දිළිඳුන්ගේ කුඩා සොයුරියෝ නිකාය

**ඉතිහාසයෙන් බිඳක්**

1839 දී එකල ප්‍රංශ කතෝලික සභා නායකත්වයෙන් ලැබූ සහයෝගය හා අවසරය මත දිළිඳුන්ගේ කුඩා සොයුරියෝ නමින් පැවිදි නිකායක් ආරම්භ කරන ලද්දේ ප්‍රංශයේ ජාන් ජුගාන් නමැති තරුණිය යි. ඇය ඉතා තරුණ වයසේ දී ම ප්‍රංශයේ වීදිවල අසරණ ව කල් ගෙවූ මහලු කාන්තාවන් තම නවාතැනේ රඳවාගෙන රැක බලා ගත්තා ය. එය තරුණ ගැහැනු ළමුන් සතර දෙනෙකුගෙන් ආරම්භ වූ අතර ජාන් ජුගාන් තරුණිය කුරුසියේ මේරි පැවිදි සොයුරිය (Sister Mary of the Cross) ලෙස පැවිදි වේදහාර ලබා ගත්තා ය. අද වන විට මහාද්වීප 5ක රටවල් 33ක් පුරා විසිරී ඇති කන්‍යාරාම 234ක පැවිදි සොයුරියෝ 2000ක් පමණ සේවයේ නිරත වෙති.

**ශ්‍රී ලංකාවට පැමිණීම**

ඉන්දියාවේ කල්කටා නිවාසයට ආධාර කළ මාලදිවයින් ජාතික ගැස්පාර් (Gaspar) නැමැත්තෙක් තම අසනීප තත්ත්වයක් හේතුවෙන් ලංකාවට පැමිණ ඇත. ඔහු එවකට ලංකාවේ සිටි ගරු ක්‍රිස්ටොෆර් බොන්ජීන් අගරදගුරු හිමිපාණන් හමු වී ශ්‍රී ලංකාවෙත් දිළිඳුන්ගේ කුඩා සොයුරියෝ නිකාය ආරම්භ කරන ලෙස ඉල්ලා සිටි අතර එයට අගරදගුරුතුමා කැමැත්ත පළ කිරීම තුළ 1888 දෙසැම්බර් මස 7 වන දින පැවිදි සොයුරියන් 7 දෙනෙකු පැමිණීමෙන් ශ්‍රී ලංකාවේ මරදාන ප්‍රදේශයේ ප්‍රථම කන්‍යාරාමය ආරම්භ විය.

**මෙහෙවර හා දැක්ම**

මෙම නිකායේ එකම සහ ප්‍රධාන මෙහෙවර වන්නේ අසරණ, දුප්පත්, රැකබලා ගැනීමට කිසිවෙකුත් නොමැති වැඩිහිටි පුද්ගලයින් රැක බලා ගැනීම යි. නිකාය ආරම්භ කළ කාලයේ ජාන් ජුගාන් තරුණිය විසින් මහලු අය රැක බලා ගැනීමට සිඟමන් ඉල්ලීම සිදු කර ඇති අතර අදට ද ලොව පුරා දිළිඳුන්ගේ කුඩා සොයුරියෝ ජාන් ජුගාන් මවුතුමිය මෙන් ම සිඟමන් යැදීමේ චාරිත්‍රය විවිධ ආයතන, නිවෙස්, දේවස්ථාන වෙත ගොස් සිදු කරයි. මරදාන නිවාසයේ මේ වන විට වැඩිහිටි ගැහැනු පිරිමි 96 දෙනකු රැක බලා ගන්නා අතර නිකායේ පැවිදි සොයුරියෝ විශිෂ්ට සේවයක් ඉටු කරති.

**දේව කැඳවීමට මං පෑදීම**

උසස් පෙළින් පසු පැවිදි සොයුරියන් වීමට පැමිණෙන දැරියන් හට තමන්ගේ නියම කැඳවීම තෝරා බේරා ගැනීමට පහසුවීම සඳහා සුළු කලක් හෝ රැකියාවක් කිරීමට පැවිදි සොයුරියන් විසින් උනන්දු කරවයි. මේ පැවිදි සොයුරියන් අවසන් වේදහාර ලබා ගැනීමට පෙර වසරක කාලයක් ප්‍රංශයේ ප්‍රධාන නිවාසයේ රැඳී සිටින අතර පසුව සුදුසුකම් ලැබූ අය අවසන් වේදහාර සතර ලබා ගැනීම සිදු කරයි. දිළිඳුන්ගේ කුඩා සොයුරියෝ නිකායට අදාළ වේදහාර සතර නම්, දිළිඳුකම, ව්‍රතශුද්ධිය, කීකරුකම හා ආගන්තුක සත්කාරය යි.

**නිකායේ ආධ්‍යාත්මික ජීවිතය**

දිනපතා උදේ දවල් සවස පැයකට වැඩි කාලයක් කණ්ඩායම් යාච්ඤාවේ යෙදෙන පැවිදි සොයුරියන් රාත්‍රියේ විනාඩි විස්සක් පමණ පෞද්ගලික යාච්ඤාව සමග දේව වාක්‍ය මෙනෙහි කර තම ආධ්‍යාත්මික ජීවිතය නිරන්තර වර්ධනයක යෙදෙයි. වැඩිහිටියන් පිරිසිදු කිරීමේ සිට සියලු කටයුතු සිදු කරන්නේ ද ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් බව පැවිදි සොයුරියන් පවසයි.

**පාඨකයාට පණිවිඩයක්**

දිළිඳුන්ගේ කුඩා සොයුරියන් ජනතාවට ආරාධනා කරන්නේ ඔවුන් කාත් කවුරුවත් නැති අසරණ වැඩිහිටියන් ආදරයෙන් බලා ගන්නා ආකාරය දැක, තමන්ගේ දෙමවුපියන් රැක බලාග න්න අවශ්‍ය දැනුම ලබා ගැනීමට හෝ නැතිනම් තමන්ගේ දේව කැඳවීම තේරුම් ගෙන දිළිඳුන්ගේ කුඩා සොයුරියක් ලෙස ඔවුන් හා සේවයට එක් වීමකට යි.

ඔබටත් සමිඳාණන්ගේ හඬ ඇසේ නම්, මෙවන් අසරණ සරණ දූත මෙහෙවරකට එකතුවන්න අප හා සමග අද ම ලියන්න.

ගරු මේරි චන්ද්‍රිකා සොහොයුරිය
දිළිඳුන්ගේ කුඩා සොහොයුරියෝ,
නො. 204,
ටී.බී. ජයා මාවත,
කොළඹ - 10.

**සටහන - දේශිකා ලියනගේ**

# සියලු සත්වයෝ නිදුක් වෙත්වා ! නිරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා ! දුකින් මිදෙත්වා !



ඉහතින් සඳහන් වනුයේ ආසියාවේ මුතු ඇටය ලෙස හඳුන්වන වසර දෙදාහකටත් වැඩි ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන, දියුණු, වටිනා සංස්කෘතියක් පිළිබඳ ව උදම් අනන, මනා සාරධර්ම පද්ධතියක් පිළිබඳ ආඩම්බරයෙන් කථා කරන ශ්‍රී ලංකාවේ නිතරම අසන්නට දකින්නට ලැබෙන තේමා පාඨයකි. තවද ශ්‍රී ලංකාවේ තරම් මෛත්‍රිය ගැන කථා කරන, උදේ හවා නිතර නිතර බණ කියන සහ බණ අහන, හන්දියක් හන්දියක් පාසා පන්සල්, පල්ලි, කෝවිල් මෙන්ම බුද්ධ ප්‍රතිමා ඇතුළු ආගමික ප්‍රතිමා පවතින්නා වූ රටක් තවත් නැති තරම් ය. එවැනි ආගමික පසුබිමක් පවත්නා රටක අනෙකාට හිරිහැර කර, ඔවුන්ව අපහසුතාවයට පත් කර පහත් තෘප්තියක් හෝ සතුටක් ලබා ගැනීමේ හැකියාවක් පවතී ද යන්න දෙවරක් සිතා බැලිය යුතු කරුණකි. නමුත් කණගාටුවට කරුණ නම් වර්තමානයේ අපට නිතර ම අසන්නට දකින්නට ලැබෙනුයේ අන් අයට පීඩා කර, හිංසා කර තෘප්තියක් ලබන පුවත් ය. ඒ අතුරින් විශ්ව විද්‍යාල නවක වදය ප්‍රධාන තැනක් ගනී. මේ අනුව වටිනා සාරධර්ම පද්ධතියකින් හෙබි ශ්‍රී ලංකාවේ මෙවැනි පරස්පර විරෝධී බවක් ඇති වන්නේ කෙසේ ද යන්න සාකච්ඡාවට භාජනය විය යුතු ම කරුණකි. විශ්ව විද්‍යාල විද්‍යාර්ථයෙක් ලෙස මෙන් ම නීති ශිෂ්‍යයෙක් ලෙස මේ සම්බන්ධව හඬක් නැගීම යුතුකමක් මෙන් ම සමාජ වගකීමක්ද සේ සලකමින් මෙම ලිපිය ලියන්නෙමි.

විශ්ව විද්‍යාලයක් වනාහි බුද්ධිමය තෝතැන්නකි. විශ්ව විද්‍යාලයක් තුළින් සිදු විය යුත්තේ උගත් හා බුද්ධිමත් රටට වැඩදායි, රටක් සංවර්ධනය කරා යන ගමනේ දී ඊට දායකත්වය ලබා දිය හැකි, මනා පෞරුෂයකින් යුත් පුරවැසියන් රටට දායාද කිරීම යි. එහෙත් මෙම නවක වදය හේතුවෙන් රටට කොතරම් වැඩදායි පුරවැසියන් අහිමි වනවා ද? නවක වදය දරා ගත නොහැකි ව උපාධි සිහිනය අත්හැර දමන ශිෂ්‍යයන් කොතරම් සිටිනවාද? එමගින් රටේ සංවර්ධනයට දායක විය හැකි වෛද්‍යවරුන්, නීතිඥවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරිවරුන් ඇතුළු උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් රටට අහිමිවීම සැබැවින් ම ඛේදවාචකයකි. නවක වදය සම්බන්ධයෙන් වාර්තා වන්නේ ඉතා සීමිත සිද්ධීන් ප්‍රමාණයක් පමණි. නමුත් වාර්තා නොවන නවක වධයට බිලිවීම් කොතරම් ඇත්ද? මෙම විශ්ව විද්‍යාල නවක වදය මුලිනුපුටා දැමීමට නම් ප්‍රථමයෙන්

ඊට හේතු වන කරුණු හා එය වැළැක්වීමට ගත හැකි පියවර මොනවාද යන්න අවධානයට ලක් කිරීම ඉතා වැදගත් ය.

නවක වදය යන්න, මානසික, කායික, චිත්තවේගාත්මක හෝ ලිංගික ආදි විවිධ ස්වරූපයන්ගෙන් යුක්ත විය හැකි අතර විශ්ව විද්‍යාල උපසංස්කෘතිය වැනි විවිධ නම් මේ සඳහා පට බැඳගෙන මෙය දිගින් දිගට ම නඩත්තු කරගෙන යාම විශාල ගැටලුවක් බවට පත් ව ඇත. ශිෂ්‍යයන් අතර සහෝදරත්වය හා බැඳීම වර්ධනය, ජ්‍යෙෂ්ඨයින්ට ගරු කිරීම මෙන්ම පෞරුෂත්වය වර්ධනය ආදි විවිධ තර්ක ඉදිරිපත් කරමින් මෙය සාධාරණීකරණය කරමින් තම අසාමාන්‍ය, කුරිරු ආශාවන් මුදුන් පමුණා ගැනීමට ඇතැමුන් උත්සාහ කරන බව පෙන්වා දිය යුතු ය. එසේම ප්‍රජාතන්ත්‍රවාදී රටක් තුළ තමන් කැමති දේශපාලන මතයක් දැරීමට ඕනෑම පුරවැසියෙකුට අයිතියක් තිබේ. නමුත් ඇතැම් විශ්ව විද්‍යාල තුළ පවතින නවක වදය හා තම දේශපාලන මතයට ඈඳා ගැනීම අතර අත්‍යන්ත සම්බන්ධයක් ඇති බවද මෙහි දී කිව යුතු ය. ඒ අනුව විශ්ව විද්‍යාලයට පරිබාහිර පාර්ශ්වයන්ගෙන් පවා මේ සඳහා යම් බලපෑමක් ඇති බව නිරීක්ෂණය කළ හැක. තම දේශපාලන මතය ජනගත කිරීම සඳහා නවක වදය යොදා ගැනීම දැඩි ලෙස හෙළා දැකිය යුතු ය. ශ්‍රී ලංකාවේ නවක වදය සම්බන්ධ ඉතිහාසය සලකා බැලීමේ දී ප්‍රථමයෙන් 1974 දී එවකට විද්‍යාලංකාර ආයතනයේ ගණිතය හැදෑරූ ශිෂ්‍යයෙක්ට කරන ලද බරපතල හිංසනය, 1975 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ රූපා රත්නසීලී නම් ශිෂ්‍යාවට සිදු කළ ලිංගික අඩත්තේට්ටම් හේතුවෙන් දෙවන මහලෙන් බිමට පැනීම නිසා සදාකාලික අබ්බගාත තත්ත්වයට පත් වීම හා ඉන් වසර 22කට පසු 1997 දී සිය දිවි හානි කර ගැනීම, 1983 දී සරත් කුමාර නම් ශිෂ්‍යයා නවක වදය නිසා සිය දිවි හානි කර ගැනීම දැක්විය හැක. එමෙන්ම මෑත කාලීනව සබරගමු විශ්ව විද්‍යාලයේ නවක වදය නිසා දැඩි මානසික පීඩාවට පත් ව සියදිවි නසා ගත් අමාලි චතුරිකා හා චරිත් දිල්ශාන් යන ශිෂ්‍යයන් නවක වධයට ගොදුරු වූවන්ගෙන් කිහිප දෙනෙකු පමණි.

නවක වදය නිසා සිදුවන මානසික බලපෑම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී ලෝකයේ විවිධ රටවල් මේ සම්බන්ධව සිදුකරන ලද පරීක්ෂණ ඇත. ඉන්දියාවේද ශිෂ්‍යයන් දහදාහක් යොදාගෙන මේ සම්බන්ධව විශේෂ පරීක්ෂණ සිදු කර තිබේ. එවැනි පරීක්ෂණවලින් සොයාගත් කරුණු හා මනෝවිද්‍යාත්මක සිද්ධාන්තවලට අනුව මෙම නවක වදය නිසා සිදුවන මානසික බලපෑම කෙටි කාලීන බලපෑම් හා දිගුකාලීන බලපෑම් ලෙස වර්ග කළ හැක. ඒ අතුරින් විශාද තත්ත්වයන් ඇතිවීම නිසා සිදුවන නින්ද නොයාම, ආහාර අරුචිය, මුහුණ දුන් බිහිසුණු සිද්ධීන් නැවත නැවත මැවී පෙනීම, මතක ශක්තිය අඩුවීම, කාන්සාව, හෘද ස්පන්දනය වේගවත් වීම. හුදෙකලාව ආදිය දැක්විය හැක. මේ හේතුවෙන් නවක වදයේ වින්දිතයන් බවට පත්වන්නන් තම අධ්‍යාපනය අඩාල කර ගැනීම හා එදිනෙදා ජීවන රටාව සාර්ථක ව පවත්වාගෙන යාමේ අපහසුතාවයකින් පෙළීම නිරීක්ෂණය කළ හැක. එසේ ම මෙමගින් සමාජය කෙරෙහි වෛරයෙන් පසු වන අන් අයගේ වේදනාවට, දුකට අසංවේදී පිරිසක් බිහිවන අතර පළිගැනීමේ චේතනාවෙන් ඔවුන් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් බවට පත් වූ පසු කනිෂ්ඨ ශිෂ්‍යයන්ව නවක වදයට ලක් කිරීමෙන් මානසික පීඩනය අඩුකර ගැනීමට උත්සාහ ගනී. එබැවින් චක්‍රයක් ලෙස මෙම නවක වදය යන ක්‍රියාවලිය දිගින් දිගටම සිදු වේ. සෑම පුද්ගලයෙකුගේම මානසික මට්ටම හා දරා ගැනීමේ ශක්තිය එක හා සමාන නොවන බැවින් පීඩනය දරා ගත නොහැකිව සියදිවි හානි කර ගන්නා ශිෂ්‍යයින්ද ඕනෑ තරම් දක්නට ලැබේ. එමගින් තමන් කුඩා කල පටන් ආදරයෙන්, බලාපොරොත්තු රැසක් පොදි බැඳ ගෙන උස්මහත් කළ දරුවා අකාලයේ මිය යාමෙන් ඔවුන්ගේ දෙමාපියන් ද දැඩි මානසික පීඩනයට පත්වේ. එමෙන්ම නවක

වදය සිදු කරන්නන් හා ඊට අනුබල දෙන පුද්ගලයින් එම ක්‍රියාවන්ට පෙළඹීමට හේතුන් මොනවාද යන්න විමසා බැලීමද වැදගත් වේ. එවැනි ශිෂ්‍යයන් නියැදීන් වශයෙන් හෝ ගෙන නිරීක්ෂණය කළහොත් අපට පෙනී යනුයේ ඔවුන්ට පවතින මානසික ගැටලු නිසා මෙසේ සිදු කරන බව යි. විශේෂයෙන්ම ළමා කාලයේ විවිධ ගැටලුවලට මුහුණ දීම නිසා තම ආත්මාභිමානය හා පෞරුෂය හීන වූවත් වැඩි වශයෙන් මීට පෙළඹෙන බවත් ඔවුන් මවාගත් පෞරුෂයන් ආරූඪ කරගනිමින් තම අණසක පතුරුවමින් නැති වූ තම ආත්මාභිමානය පවත්වා ගැනීමට මෙසේ හැසිරෙන බව අපට දැක ගත හැක. එසේම සමාජ විරෝධී ආකල්ප (Anti Social) දරන එනම් අන් අයගේ දුක දැක මානසික සතුටක් ලැබීමද එක්තරා මානසික රෝගයකි. එසේම තමා පුද්ගලිකව නවක වදයට විරුද්ධ වූවත් එසේ විරුද්ධ වීමෙන් තම අයිතිවාසිකම්ද උල්ලංඝනය වේ යැයි බියෙන් එල්ල වන පීඩාව අඩු කර ගැනීම සඳහා බහුතර මතයට හිස නමා මීට සහභාගි වන්නන්ද අපට දැක ගත හැක.

නවක වදය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින නීති තත්ත්වයද සාකච්ඡා කිරීම මෙහිදී වැදගත් වේ. මානව හිමිකම් යනු මෙලොව මනුෂ්‍යයකු ලෙස ඉපදීම නිසාම හිමිවන්නා වූ අයිතිවාසිකම් වේ. ඒ අනුව නවක වදය හරහා මෙලෙස වද හිංසාවට ලක් කිරීම ප්‍රබල මානව හිමිකම් උල්ලංඝනය කිරීමකි. එසේම ශ්‍රී ලංකාවේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව හරහා කෲර අමානුෂික වද හිංසා මෙන්ම අවමං සහගත සැලකිල්ලට ලක් නොවීමේ අයිතිවාසිකම මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගෙන තිබේ. එසේම එහි 12(1) ව්‍යවස්ථාව හරහා සර්ව සාධාරණත්වයේ අයිතිය එනම් නීතිය ඉදිරියේ සැවොම සමාන වීමේ අයිතිය පිළිගෙන තිබේ. එසේම 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතන වල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනතේ 2වන වගන්තියට අනුව අධ්‍යාපන ආයතනයක් තුළ හෝ ඉන් පිටත නවක වදය සිදු කරන මෙන්ම ඊට සහභාගි වන්නෙක් අධිකරණය ඉදිරියේ වරදකරු වුවහොත් වසර 2කට නොඅඩු සිර දඬුවම් මෙන්ම හානිය සඳහා වන්දි ගෙවන ලෙසටද අධිකරණයට නියෝග කළ හැකි ය. තවද නවක වදය යටතේ සාපරාධී බිය ගැන්වීම, අඩස්සියට ගැනීම, අයුතු ලෙස අවහිර කිරීම, අයුතු ලෙස සිරකර තැබීම ආදි ක්‍රියාවන්ද මෙම පනත යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි ලෙස හඳුනාගෙන තිබේ. මෙම පනතට අනුව නවක වදය සිදුකිරීමේ දී ලිංගික අතවරයක් හෝ බරපතල තුවාලයක් සිදු කිරීමට වරදකරු කරන ලද්දේ නම් වසර 10ක සිර දඬුවමක් ලබාදිය යුතුය. එසේම අදාළ වරදකරු එම අධ්‍යාපන ආයතනයෙන් නෙරපීම සඳහා අධිකරණ නියෝගයක් නිකුත් කිරීමේ හැකියාවද පවතී. මේ අනුව පැහැදිලි වන්නේ නවක වදය රටේ පිළිගත් නීතියට අනුව **අපරාධමය වරදක්** වන බවයි. තමන් කැමති ඇඳුමක් ඇඳීමට, කැමති ස්ථානයකට යාමට, තමන් අකමැති දෙයක් සිදු නොකර සිටීමට ඇති අයිතියට බාධා කරන්නේ නම් එවිට එකී පුද්ගලයාට අහිමි වනුයේ පුද්ගලික නිදහසයි (personal Liberty). එසේම නවක වදයට ලක්වන ශිෂ්‍යයාගේ අධ්‍යාපන අයිතියටද මෙමගින් දැඩි පහරක් එල්ල වේ. එපමණකුද නොව මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ඇතුළු විවිධ අන්තර්ජාතික සම්මුතීන් මගින් පවා මෙවැනි මානව ගරුත්වය, පුද්ගල නිදහස ඇතුළු සමානාත්මතාවයට අදාළ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අවධානයට ලක් කොට තිබේ.

ඉතිරි කොටස ලබන කලාපයට...

**ෂෙලින්ඩා සමරසිංහ**
**නීති පීඨය, අවසන් වසර**
**කොළඹ විශ්ව විද්‍යාලය**

# ජීවිතය දිගු ගමනකි ( කෙටි කතාව )

"දුව සයුරි මෙහෙ එන්න."

"ඇයි තාත්තෙ?"

"ඔයාගෙයි නුවන්ගෙයි තියෙන සම්බන්ධය මොකක් ද?"

"ඇයි ඇයි තාත්තෙ ඇයි?"

"නෑ නෑ කලබල වෙන්න දෙයක් නැහැ. මගේ ප්‍රශ්නයට උත්තර දෙන්නකො."

"අපේ පල්ලියෙ ගායනා කණ්ඩායමේ කාන්තා අංශයෙ මූලිකයා මම. නුවන් පිරිමි අංශයෙ. ඕගන් එක වාදනය කරන්නෙත් නුවන් තමයි."

"මට ආරංචියක් ආවා දුවයි නුවනුයි අතර ඊට එහා ගිය සම්බන්ධයක් තියෙනවා කියලා. ඒ ආරංචිය බොහෝ දුරට නිවැරදි බව යි මට නම් ආරංචි උනේ."

"අපි එකට ම තමයි ඉන්නෙ. පුහුණුවීම්වල දී ඉතිං මුළු දවස ම එකට ම යි ඉන්නෙ තාත්තෙ. අපි දෙන්න විතරක් නෙවෙයි හැමෝම ඉන්නවා."

"මම දන්නවා ඒක. ඒත් අපට නුවන්ගෙ පවුලත් එක්ක පෑහෙන්න බැහැ. ඔයා දන්නවනෙ මම මේ ප්‍රදේශයෙ ඉන්නෙ කොහොමද කියලා. අයියත් දැන් ළඟදීම දොස්තර කෙනෙක්. ඉතිං ඔයාට බැහැ අපිට නොගැලපෙන කෙනෙක් එක්ක පෑහෙන්න තේරුණා ද?"

"තේරුණා තාත්තෙ."

"මම දන්නවනෙ නුවන්ලගෙ පවුලෙ තොරතුරු. තාත්තා මේසන් බාස්. අම්මා ගෙවල්වල වැඩට යනවා. නුවන්ට බාල තව දෙන්නෙක් ඉන්නවා. ඉතිං ඒ පවුල ප්‍රශ්න ගොඩක ඉන්නෙ. මතක තියා ගන්න අම්මත් නැතිව ඔය දෙන්න ම උස් මහත් කළේ බොහෝ ම දුක් විඳල, මගේ ව්‍යාපාර කටයුතුත් අඩාල කරගන්නෙ නැතිව, මගේ සතුට ගැන බලන්නෙත් නැතිව තමයි මෙතැනට ආවෙ. ඉතිං මම හිතනවා ඔයා ඒ ගැන හිතයි කියලා."

සයුරි කාමරයට වැදී හිස අත් බදාගෙන කල්පනා කළා ය. සැමට ම හොරෙන් නුවන් සමඟ ඇති කර ගත් ආදර සබඳතාවය තාත්තාගේ කන වැකුණේ කෙසේ දැයි කල්පනා කළා ය. ඇයට සිතා ගැනීමට වත් නො හැකි ය. පසුදින ගායනා පුහුණුවීම් සඳහා ගිය විට ඇය දුවගෙන ගොස් නුවන් හමු විය.

"අනේ නුවන් බලන්නකො අපි දෙන්න ගැන තාත්තට කවුරුහරි කියල තියෙනව. මට හිතාගන්න බැහැ කවුරු කිව්වද කියලා."

"මොනවා ! හරි පුදුමයක් නෙ. මටත් හිතාග න්න බැහැ. හැමෝම අපිට විහිළු කළාට කවුරුවත් දන්නෙ නැහැනෙ අපි දෙන්නගෙ සම්බන්ධෙ ගැන."

"මට හරි බයයි නුවන්."

"ඔයා බය වෙන්න එපා. උපාධි ප්‍රතිඵල ආවහම මට හොඳ රස්සාවක් ලැබෙයි. දැනටත් මම පුංචි ව්‍යාපාරයක් කරනවනෙ. ඒකත් සාර්ථක යි. කාලයක් එක්ක අපේ ප්‍රශ්න විසදෙයි. එතකන් අපි ප්‍රවේශම් වෙමු."

නුවන් එසේ කීවත් ඇත්ත තත්ත්වය පහදා දීමට ඇයට නොහැකි ය. ඔවුන්ගේ දුප්පත් බව මතු කරමින්, තාත්තා කතා කළ හැටි ඇයට මැවි මැවී පෙනිණ. නමුත් ඒ බව ඔහුට කීමට ඇගේ දිව නොනැවෙයි. එසේ කීම ඔහුට අපහාසයක් යැයි ඇයට සිතේ.

කාලයක් ගත විය. නුවන් ඉංජිනේරු උපාධියේ ප්‍රථම පංතියේ සාමාර්ථයක් ලබා ගත්තේ ය. ඒ සමඟ ම රැකියාවක් ද ලැබිණ. ඒ අතර සයුරිගේ සොහොයුරා ද වෛද්‍යවරයෙක් ලෙස පත්වීමක් ලැබුවේ ය. දිනක් සයුරිගේ පියා,

"දුව දැන් ඔයාගෙ කල වයසත් හරිනෙ. හොඳ කෙනෙක් බලමු නේද?"

"අනේ තාත්තෙ දැන් ම බඳින්න බැහැ. අපි අයියට කෙනෙක් හොයමු."

"අයියට කලින් නංගි බඳින්න ඕනෙනෙ. අයියත් එක්ක එකට විශ්වවිද්‍යාලෙ හිටපු ළමයෙක් ගැන කිව්වා. එයා ලබන අවුරුද්දෙ දොස්තර කෙනෙක්ලු. කොළඹ ලොකු සල්ලිකාර පවුලක්ලු."

"අනේ තාත්තෙ මට සල්ලිකාරයො නම් එපා."

"ඇයි හිඟන්නෙක්ව ද බඳින්න යන්නෙ? මම හොයන්නම්කො හොඳ කෙනෙක්."

සයුරී කිසිත් කතා නො කළා ය. තම පියා යමක් සිතුවොත් එය අනිවාර්යයෙන් ම කරන බව ඇය දනියි. අවස්ථාවක් ලද විගස ඇය නුවන්ට මේ ගැන කිව්වා ය. ඔහු කියන්නේ බය නැතිව ඉන්න කියා ය. නමුත් සයුරී තම පියා ගැන හොඳ හැටි දන්නා නිසා බියට පත්ව සිටී. නමුත් නුවන් ඒ ගැන නො දනී.

"සයුරී ඔයා බය නැතිව ඉන්නකො. බැරිම උනොත් අපි ෆාදර්ට කියල කියවමු. මම දැනටමත් අපේ ෆාදර්ට කියලයි තියෙන්නෙ."

"ෆාදර් මොකද කිව්වෙ?"

"කොල්ලෝ උඹ ගින්දරට අත දාන්න යි යන්නෙ" කියලා කිව්වා.

ටික කාලයක් මෙසේ ගත විය. දිනක් "දුව මේ සෙනසුරාදා මගෙ හොඳ යාළුවෙක් එනවා. එයාගෙ පුතත් එක්ක. ඔයාව බලන්නයි එන්නෙ. මාත් එක්ක කරට කර ඉන්න බිස්නස්කාරයෙක්. කෑම ගැන මම බලාගන්නම්. ඔයා ලස්සන සාරියක් තෝරගෙන සූදානම් වෙන්නකෝ."

පියාගේ මෙම දැනුම් දීමට විරුද්ධව වචනයක් වත් කීමට ඉඩ නො ලැබුණි. ඇය හෙමිහිට කාමරයට වැදී කඳුළු සලමින් නුවන්ට දුරකථන ඇමතුමක් දුන්නා ය.

"හරි හරි ඔයාව දැකපු දා ම ගෙනියන්නෙ නැහැනෙ. ඔයා කලබල නොවී තාත්තා කියන දේ කරන්නකො. අපි ඉරිදට හමු වෙනවනෙ."

සෙනසුරාදා දිනය එළඹියේ ය. සයුරී සියල්ලට ම මුහුණ දුන්නා ය. පැමිණි පිරිසට සංග්‍රහ කර පිටත්කර හැරියේ ය.

"දුව මොකද කියන්නෙ? බොහොම ප්‍රසන්න යහපත් දරුවෙක්. මම හිතන්නෙ දුවට හොඳටම ගැලපෙනවා කියලයි. මට නම් කියන්න කිසිම වැරැද්දක් නැහැ."

"අනේ මට බැහැ තාත්තෙ."

"ඇයි ඇයි මොකක්ද ඒ ළමයගෙ තියෙන අඩුපාඩුව? අද හෙට බඳින්න නෙවෙයිනෙ. කථා බහ කරලා ආශ්‍රය කරලා දැන අඳුනගෙන තමයි බඳින්නෙ."

ඇය නිහඬ වූවා ය. පසුදින ඉරිදා නුවන් සහ සයුරි හමු වූයේ ය.

"සයුරි කොහොමද මනමාලයා ලස්සන ද?"

සයුරිට කේන්ති ගියේ ය. ඇය නුවන්ට බැන වැදුණා ය.

"මම විහිළුවක් කළේ සයුරි. මම දවසක එන්නම් ඔයාගෙ තාත්තා මුණගැහෙන්න. ඇවිල්ලා කෙලින් ම අහන්නම්."

"අනේ නුවන් තාත්තා බනියි ඔයාට."

"කමක් නෑ සයුරි. අපි කවදාහරි මේ දේට මූණ දෙන්න ඕනනෙ. මම එන්නම්. ඔයාගෙ තාත්තා මොනව කිව්වත් මම ගණන් ගන්නෙ නැහැ. දැන් මගෙ රස්සාව ස්ථිරයි. මගේ ව්‍යාපාරයත් සාර්ථක වේගෙන එනවා. ඉතිං කියලා බලමු. බැරි උනොත්..."

"එතකොට මොකද නුවන් කරන්නෙ?"

"ඒක එතකොට බලමුකො. මම ලබන සෙනසුරාදා එනවා. ඔයා බය නැතිව ඉන්නකො."

එම සතියේ දින ගෙවී ගියේ ඉතාමත් වේගයෙන් යැයි සයුරිට සිතිණි. ඉතාමත් නොසන්සුන් සිතකින් ඈ කාලය ගෙව්වා ය. සෙනසුරාදා දිනය උදා වූයේ ය. උදේ දහයට පමණ නුවන් පැමිණියේ ය. එවිට සයුරිගේ පියා පුවත්පත බලමින් ආලින්දයේ වාඩිවී සිටියේ ය. නුවන් පැමිණ දොරට තට්ටු කළේ ය. පියා පත්‍රය නවා තබා ඉදිරියට ගියේ ය.

"මම මහත්තයා මුණ ගැහෙන්නයි ආවෙ."

"ඔයා පල්ලියෙ කන්තාරු කණ්ඩායමේ නුවන් නේද?"

"ඔව්."

"ඇයි මොකක්ද ප්‍රශ්නය?"

"මම කෙලින්ම මාතෘකාවට බහින්නම්කො. මමයි මහත්මයගෙ දුව සයුරියි අතර සම්බන්ධයක් තියෙනවා. අපි දෙන්නට දෙන්නා ආදරෙයි. ඉතිං මම ඔබතුමා මුණගැහෙන්න ආවෙ ඒ ගැන කියන්නයි."

"මොනවා ! ඔය ළමයට පිස්සු ද? මම හොඳ තැනකින් සයුරිට කටයුත්තක් කථා කරලා තියෙන්නෙ. ඒ අය බොහෝම කැමතියි. ඉතිං ඔය ළමයගෙ වචනය ගැන සලකලා බලන්නවත් බැහැ."

"ඒ යෝජනාවට සයුරි කැමති නැත්තම්?"

"මට එයාගෙ කැමැත්තෙන් වැඩක් නැහැ. ඒ මංගල්‍යය තමයි කෙරෙන්නෙ. ඔය ළමයා හිතලා බලන්න ඔයාලගෙ පවුලයි අපියි ගැලපෙනවාද කියලා? මම තවත් විස්තර කරන්න අවශ්‍ය නැහැ යි කියලා මම හිතනවා. දෙන්නම හොඳ හිතින් මේ අදහස අතහැර ගන්න." පියා කේන්තියෙන් කෑ ගැසුවේ ය.

"මහත්මයා මම ඉංජිනේරුවෙක්. මට ස්ථිර රැකියාවක් තියෙනවා. මම ව්‍යාපාරයක් පටන් අරගෙන තියෙන්නෙ. ඒකත් සාර්ථකව කෙරීගෙන යනවා. තාත්තා මේසන් වැඩ කළා කියන එකයි අම්මා ගෙවල් වල වැඩ කළා කියන එකයිනෙ මහත්මයා නොකියා කියන්නෙ. ඒක මට ලැජ්ජාවට කාරණයක් නෙවෙයි. ඒ දෙන්නගෙ දහඩිය මහන්සියෙන් තමයි මම ඉගෙන ගෙන මේ තත්ත්වයට ආවෙ. ඒක මට ආඩම්බරයක්."

"මට ඔය කතා වලින් වැඩක් නැහැ. මම ඔය ළමයගෙ යෝජනාවට කැමති නැහැ. කරුණාකරලා යන්න, මාව නරක මිනිහෙක් කරන්නෙ නැතිව."

"බොහොම ස්තුතියි මහත්මයා" කියා නුවන් පිටව ගියේ ය. මේ කතා බහ අසා සිටි සයුරි බියෙන් වෙව්ලමින් ගේ තුළ සිටියේ ය. සයුරිගේ පියා කේන්තියෙන්;

"දුව සයුරි මෙහෙ එනවා. දන්නවද දැන් කවුද ආවෙ කියලා?"

"ඔව් තාත්තෙ."

"මම ඔය දෙන්නගෙ සම්බන්ධයට කැමති නැහැ. මගෙන් කිසිම අවසරයක් ලැබෙන්නෙ නැහැ. මීට පස්සේ ඔය ගායනාවලට යාම තහනම්. ඔයාට මාත් එක්ක පමණයි යන තැනක යන්න පුළුවන්. පල්ලියටත් එහෙමයි."

ඇය හඬමින් ම කාමරයට දිව්වා ය. ඇය රාත්‍රියේ හෙමිහිට නුවන්ට විස්තර කිව්වා ය.

"ඔයා බය නැතිව ඉන්නකො. මම අපේ ෆාදර්ට කථා කරන්න කියන්නම්කො."

"මට බයයි නුවන් තාත්තා ෆාදර්ටත් බනියි ද දන්නෙ නැහැ."

"බලමුකො."

දිනක් සවස් යාමයේ පියතුමා සයුරිගේ නිවසට පැමිණියේ ය. තාත්තා ගරුසරු ඇතිව එතුමාව පිළිගත්තේ ය. සුහදව කතා බහ කරගෙන යන අතර දී;

"විල්සන් මහත්මයා මම ආවෙ විශේෂ කටයුත්තකට. මම මහත්මයගෙ දුව සයුරිවත් හොඳට අඳුරනවා. ඒ වගේ ම නුවන් පුතාවත් හොඳට ම අඳුරනවා. ඉතාමත් ගුණ යහපත් දරුවො. ඉතිං ඒ වගේ දරුවො දෙන්නෙක් එකතු වෙන ඒකට ඇයි මහත්මයා විරුද්ධ වෙන්නෙ?"

"සයුරිට මංගල යෝජනාවක් ඇවිල්ල තියෙනවා ෆාදර්. ඒ අය හොඳටම කැමතියි. එයාලා බොහොම ලොකු බිස්නස්කාරයො. මගේ කරට කර ඉන්න කෙනෙක්. එහෙම කෙනෙක් සම්බන්ධ උනොත් ඒක ලොකු වාසනාවක් නෙවෙයි ද? ඒ නිසා ඔබතුමා මේ ගැන වද වෙන්න එපා."

"මහත්මයගෙ අදහස හරිම වැරදියිනෙ. දරුවෙක් ව්‍යාපාරයක් වෙනුවෙන් හිලවු කරන්න හොඳ නැහැනෙ."

"කවුද එහෙම කරන්නෙ? ඒ අය බොහොම කැමතියි අපේ දුවට. අද හෙටම හරි විවාහ කටයුතු කරන්න එයාලා ලෑස්තියි."

"ඒත් සයුරි දුව අකැමති නම්?"

"එයා මගේ දුව! මම කියන දේ අහන්න ඕනෙ. එයාට යහපතක් මම කරන්නෙ."

"නමුත් මහත්මයා දරුවෝ දෙන්නගෙ කැමැත්ත නේද බලන්න ඕනෙ."

"ෆාදර් කරුණාකරලා මගේ පවුලෙ ප්‍රශ්න වලට පැටලෙන්න එපා. මම නුවන්ට කැමති නැහැ. එච්චරයි. මෙහෙම තදින් ඔබතුමාට කථා කරනවාට මට සමාවෙන්න ඕනෙ."

"කමක් නැහැ. කමක් නැහැ. මම යන්නම්. ඒත් තව පොඩ්ඩක් හිතලා බැලුවොත් හොඳයි නේද?" කියමින් පියතුමා පිටව ගියේ ය.

ඉන්පසු සයුරිගේ පියා කෝප වී කෑගසමින් සයුරිටත් නුවන්ටත් බැන වදිමින් "දැන් ඉතිං ඉක්මනට කසාද බඳින්න සූදානම් වෙනවා. මගේ ඉවසීමේ සීමාව පැනලා තියෙන්නෙ." යැයි කීවේ ය. ඉන් ඉක්බිති එළඹියේ ඉතාමත් කලබලකාරී කාලයකි. සයුරිගේ විවාහයට පියා විසින් දින නියම කරගෙන ඒ සඳහා සූදානම් විය. දැන හඳුනා නොගත්, නො දන්නා අයකු හා විවාහ වීමට සයුරිට නොහැකි ය. ඕ කඳුළු පෙරමින් සෑම විටම කල්පනා කළා ය. දිගින් දිගටම කල්පනා කළා ය. ඇය පියා ඉදිරියේ වැඳ වැටෙමින්;

"අනේ තාත්තෙ, මේ කසාදෙ කරන්න බැහැ. මේක නවත්තන්න. මම නුවන්ව අමතක කරන්නම්. මෙයාව නම් බඳින්න බැහැ. මම අඳුරගෙනවත් නැහැ. වචන කීපෙකට වඩා කතා කරලත් නැහැ. ඊටත් පල්ලියෙන් නෙවේනෙ දැන් මාව බන්දන්න යන්නෙ. මට බැහැ තාත්තෙ, මට බැහැ."

"ඒ පවුලම මම හොඳට දන්නවා. ඒ දරුවත් බොහෝම හොඳ දරුවෙක්. බිස්නස් වලටත් දක්ෂයි. ඔයා දැන් ඇඬුවට බැන්දට පස්සෙ සන්තෝෂ වෙයි. මේක තමයි ඔයාට තියෙන හොඳම අවස්ථාව. පස්සෙ පල්ලියෙන් කසාදෙ රෙජිස්ටර් කරන්න පුළුවන්. එයාලත් කැමති, ඔයාගෙ හිතුවක්කාරකම හින්දනෙ මේ හදිස්සියෙ ම මඟුලක් ගන්නෙ."

කොපමණ කිව්වත් පියාගෙ සිත වෙනස් කිරීමට ඇයට නොහැකි විය. අවසානයේ සයුරි අකැමැත්තෙන් නමුත් තද තීරණයක් ගත්තා ය. නුවන් සමඟ රහසේ ම වැඩපිළිවෙලක් කතා කර ගත්තා ය. ඇඳ සිටි ඇඳුම පිටින් ම අවශ්‍ය ලියකියවිලි පමණක් රැගෙන, එක් රාත්‍රියක ඕ නුවන් සමඟ මඟට බැස්සා ය. නුවන්ගේ ක්‍රමවත් වැඩපිළිවෙලකට අනුව, මේ යුවළ රහසේ ම පියතුමා හමු වී දේවස්ථානයේ විවාහය ලියාපදිංචි කළේ ය.

ඉක්බිති නුවන් කල් ඇතිව සූදානම් කරගත් පරිදි ඈත ප්‍රදේශයකට ගොස් පදිංචි විය. නුවන් ඒ ප්‍රදේශයේ ම රැකියාවක් සොයා ගත්තේ ය. නුවන්ගේ දෙමාපියන් සහ සහෝදර සහෝදරියන් ද ගෙන්වා ගත්තේ ය. නොයෙකුත් බාධක දුක් කම්කටොලු ජය ගනිමින් මේ යුවළ සතුටින් ජීවත් විය. දින සති මාස අවුරුදු ගෙවී දරු දෙදෙනෙකුගේ මාපියන් බවට ද පත් විය. දෙදෙනා ම වෙහෙස මහන්සි වී නුවන්ගේ ව්‍යාපාර කටයුතුත් සාර්ථක කර ගත්තේ ය. සයුරි නිතර ම තම පියා ගැන කනගාටු විය. නමුත් කරන්නට දෙයක් නැත. ලැබුණු ආරංචිවල හැටියට සිය සහෝදරයා ද විවාහ වී විදේශ ගත වී ඇත. පියා ගැන කිසිදු ආරංචියක් නොලැබුණි.

දිනක් මේ දරු පවුල විනෝද චාරිකාවක් යද්දී හදිසියේම නෙත ගැටුනු දර්ශනයෙන් සයුරි සතුටට පත් විය. එනම් ඇගේ සහෝදරයා සහ සුරූපී කාන්තාවක් දැකීමෙනි. වහා ම ඇය දුව ගොස් සිය සහෝදරයා වැළඳ ගත්තා ය. ඔහු ද පුදුමයටත් සතුටටත් පත් විය. අයියාගේ බිරිඳව ද හඳුනා ගත්තා ය. ආ ගිය තොරතුරු විමසද්දී, තම පියා මියගිය බවත්, සොහොයුරා ගෙවල් දොරවල් ව්‍යාපාර සෑම දෙයක් ම විකුණා විදේශ ගත වූ බවත් දැන ගත්තා ය. තම පියාගේ මරණය ඇසූ ඇය ඉමහත් ශෝකයට පත් වූවා ය. තමාගේ පිටවීම මරණයට හේතු වූවා යන අදහස නිසා තවත් වික්ෂෝපයට පත් වූවා ය.

ඉන්පසු සයුරි තාත්තා වෙනුවෙන් අවුරුදු පතා වැඩිහිටි නිවාසවලට දාන මාන දීම නොකඩවා කරගෙන ගියා ය. එක් අවුරුද්දක දී ඇය දානයක් පිළියෙල කරගෙන ඈත ප්‍රදේශයක වැඩිහිටි නිවාසයකට දරු දෙදෙනා සහ නුවන් සමඟ ගියා ය. මේ සිව්දෙනා මහත් ආදරයකින් ගෞරවයකින් මව්පියවරුන්ට සංග්‍රහ කළෝ ය. ඔවුන් සමඟ කතා කරමින් විහිළු තහලු කරමින් සිටියේ ය. හදිසියේ ම සයුරි මහළු පියෙක් ළඟ නැවතුනා ය. ඔහු ළඟ දණ ගසා ගත්තා ය. හොඳින් ඔහු දෙස බැලුවා ය.

"අනේ මේ මගෙ තාත්තා නේද? අනේ තාත්තේ මම තාත්තගෙ දුව සයුරි" කියමින් ඒ මහළු පියාව වැළඳ ගත්තා ය.

"අනේ මගෙ දුවේ මට සමාවෙන්න මගෙ දුවේ."

"තාත්තෙ අයියා කිව්වනෙ තාත්තා මැරුණා කියලා."

"ඔව් දුවේ, එයාට මාව මැරිලා තමයි. මම ඔයා ගියාට පස්සෙ කේන්තියට ගේ දොර ඉඩකඩම් ව්‍යාපාර ඔක්කොම විකුණලා දැම්මා. ඊට පස්සෙ මාව මේ නිවාසෙට ගෙනත් දමල රට ගම අතහැරලා ගියාලු. කොහෙ ඉන්නවද දන්නෙත් නැහැ. එක සැරයක් වත් මාව බලන්න ආවෙ නැහැ දුවේ. හැබැයි මාසෙන් මාසෙට සල්ලි එවනවලු මේ නිවාසෙට." කියමින් හඬා වැටුණේ ය.

"තාත්තෙ අඬන්න එපා. මම නිසානෙ මේ ඔක්කොම උනේ. ඒත් ඉතිං මම දැන් සතුටින් ඉන්නවා තාත්තෙ. තාත්තා යමු අපේ ගෙදර. මට හරි සතුටුයි. මැරිලා කියලා හිතන් හිටපු මගෙ තාත්තා ජීවත් වෙනවා."

"අනේ මගෙ දුවේ, මට හරි සතුටුයි දැන්. මම මේ නිවාසෙ තනිවෙලා ඉන්නැද්දි මගේ ඇස් ඇරුණා දුවේ. මම කොයි තරම් වැරදිද කියලා මට තේරුනා. මගේ දුවව මුණ ගස්වන්න කියලා විතරයි මම දෙවියන්ගෙන් ඉල්ලුවෙ. මගෙ ඉල්ලීමට උන් වහන්සේ අද උත්තර දුන්නා දුවේ" කියමින් කඳුළු සැලුවේ ය.

"තාත්තා කනගාටු වෙන්න එපා දැන් සතුටු වෙන්න. නුවන් එන්න දරුවොත් එක්ක එන්න. මේ මගෙ තාත්තා අඳුරන්න පුළුවන් ද?"

"අනේ පුතේ මට සමාවෙන්න. මට ලැජ්ජයි පුතේ මම ඔයාට කිව්ව දේවල්වලට."

"එහෙම හිතන්න එපා තාත්තෙ. දෙමව්පියො තමන්ගෙ දරුවන්ට හොඳක් කරන්නනෙ හිතන්නෙ. යමු අපිත් එක්ක අපේ ගෙදර. මේ ඉන්නෙ අපේ දුවයි පුතයි. එන්න පුතා, එන්න දුව මේ ඉන්නෙත් ඔයාලගෙ සීයා. ඔයාලගෙ අම්මගෙ තාත්තා" කියමින් නුවන් දරු දෙදෙනාව සීයා වෙතට ළං කරවීය. සීයා මහත් සෙනෙහසින් දරු දෙදෙනා තුරුළු කර ගත්තේ ය. එතැන ඒ මොහොතේ සතුට පිරී ඉතිරී ගියේ ය.

**ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න**

# මනුඝය ගත් දෙවි අභිමතය

සග ලොව සිහසුන හැරදා මනු වූ
මිරිවැඩි සඟලෙද දූලි පැටලුනූ
රජ තෙද බල පෙම දිළිඳුගේ සෙත වූ
ලෝ විස නසනට හෙළ මත බිලි වූ


තමනට වැඩි අනුනට අත දිගු වූ
ඒ දිගු කළ දෑතග ඇණමිටි බර වූ
රන් කිරුළෙහි විස කටු අතු පැටැලූ
දොම්නස දුරුකර සොම්නස බෙදලූ

අඳුරකැරා පිපි කුසුම වියැකුණු
මොහොතට පෙරතුව වදනින් සමු දුන්
ලෝ පුතුනට මව් ස්නේහය දන් දූ
ඒ නටුවෙන් කුසුමට නුඹ යා වනු

නිසරු බිම් සොයා තිසරු කළා වූ
බැහැරවී කැඩි සිත් එකලු කළා වූ
තමකම නසනට හුරු කෙරුවා වූ
මුද්‍රා සිඳු පොතෙ පිට පෙරළා වූ

**රවිඳු ප්‍රසන්න**

# පවුල් දිවිය වන්දනා ගමනකි



කිතුනුවන් වන අප හැම වන්දනා ගමන්හි යෙදෙන්නට උනන්දුවක් දක්වමු. විශේෂයෙන් ම එළැඹෙන අගෝස්තු මාසයේ දී පාසල් නිවාඩුවත් සමඟ ම විනෝද ගමන් යන්නා සේ ම වන්දනා ගමනක යාමට ද පවුල් ලෙස උත්සුක වෙයි. ඒ අතරින් තලවිල, කලාඔය, මඩු සිද්ධස්ථාන ප්‍රධාන තැනක් ගනියි. මෙම ලිපිය තුළින් මා උත්සාහ ගන්නේ වන්දනා ගමනකත්, පවුල් ජීවිතයේත් සමානතා විග්‍රහ කිරීමට යි. මා ආදර්ශයක් ලෙස පවුල් ජීවිතයක් සලකනවා නම් ඒ නිසැකයෙන් ම මගේ දෙමව්පියන්ගේ සෙනෙහසේ කැදැල්ල තුළ දිවිගෙවන පවුල යි. අපේ පවුලේ පරමාදර්ශී පවුල නම් ජේසු, මරිය, ජුසේ නමැති ශුද්ධ වූ පවුල යි.

වන්දනාවට ප්‍රවිශ්ටයක් ලෙස පවුලක් ආරම්භ වන්නේ විවාහයෙනි.

**වි - විශ්වාසයේ**

**වා - වාසභවනය**

**හ - හමුවන**

**ය - යථාර්ථය**

කිතුනු අපගේ විශ්වාසයේ වාසභවනය වූ කලි ස්වර්ග රාජ්‍යය යි. මෙලෙස එකී ස්වර්ගීය අත්දැකීම මිහිපිට යථාර්ථයක් වන තෝතැන්න පවුල් දිවිය යි. තම පවුල් දිවිය මිහිපිට ස්වර්ගයක් හෝ අපායක් කර ගැනීම කුටුම්භයක සාමාජිකයන් සතු දෙයකි. එනමුත් කිතුනු ඉගැන්වීම හා සභා මඟ පෙන්වීම නැඹුරු වී ඇත්තේ එම අත්දැකීම ස්වර්ගීය එකක් කර ගැනීමට යි. එනම් පවුල් දිවියේ ඉලක්කය ලෝකෝත්තර එකකි. නමුත් අවාසනාවකට මෙන් වර්තමාන සමාජ විකෘතිය අද පවුල් ජීවිතය රැගෙන යන්නේ වෙනස් ම දිශානතියකට ය. සංකර, පටු අරමුණු ඉලක්කගත ඇතැම් පවුල් ජීවිත, එහි ආරම්භය වන විවාහයට දෙන පහත නිර්වචනයෙන් ම ඒ බව මනාවට ගම්‍ය වේ.

වි - විගහට

වා - වාහනෙන්

හ - හනිමූන්

ය - යමු

"පවුලක් පන්සලක් වෙනවා" යන කියමන අප ජනවහරේ සුලබව ඇසෙන්නට ලැබෙන්නකි. අපේ පැරැන්නන් පවා පවුල් ජීවිතයකට අවතීර්ණ වීම වන්දනාවකට මුල පිරීමක් ලෙස සලකා ඇති බව ඉන් පැහැදිලි ය. සේනානායක වේරලියද්දයන් විසින් ගායනා කරන සියඹලාගමුවේ අමරදාස විසින් රචිත 'කන්ද පිරිමැද' ගීතයේ අපට හමුවන තරුණයා ද තමාට වයසින් බාල තරුණියක විසින් කසාදයකට නැත්නම් පවුල් ජීවිතයක් වෙනුවෙන් කරන පෙරැත්තට පිළිතුරු වශයෙන් පවසන්නේ,

"වන්දනාවක යන්නෙ කොහොමද නංගියේ අපි දැන් ම මඟ බැහැලා?"

එපමණකදු නොව, ප්‍රවීන ගායන ශිල්පී අමරසිරි පීරිස් මහතා විසින් ගායනා කරන ආචාර්ය රෝහණ වීරසිංහයන් විසින් තනු නිර්මාණය කරනු ලැබූ 'ස්නේහයේ නගරයයි' ගීතයේ, අන්තරා කොටසේ එන පද පෙළක් ද උපුටා දක්වනු කැමැත්තෙමි.

"ස්නේහයේ නගරයයි සිත මගේ
මාවතක් හෝ නොවූ රාගයේ
වන්දනාවේ ගිහින් ඉන්න ආසයි මටත්
කොයි ඉසව්වේ ද ඒ මෙත් පුරේ"

යථෝක්ත ගීත ඛණ්ඩයෙන් ද නැවත නැවත සනාථ වන්නේ ස්නේහයේ මෙත් පුරය වන පවුල් දිවිය වන්දනාවක් ම බව යි. තවද පෙර සඳහන් කළ පරිදි මධුසමයට හදිසි කරන රාගයේ මාවතක් නොවන බව ද පැහැදිලි වේ. ජේසු, මරිය, ජුසේ නමැති ශුද්ධ වූ පවුල ද වන්දනා ගමන් වල නියැලුණ බව ශු. බයිබලයේ ලූක් සුභාරංචියේ 2:41 වගන්තියෙන් ගෙනහැර දක්වයි.

එසේ නම් වන්දනාවේ දී අපි;

- **සංවර වෙමු :** පුදබිම්, වන්දනා සිද්ධස්ථානවලදී මෙන් පවුල් ජීවිතය සංවර පවුල් ජීවිතයක් කර ගනිමු.
- **කට පරිස්සම් කර ගනිමු :** සියලු අඬ දබර වලට මූල බීජය වන හිත් රිදෙන වචන භාවිතයෙන් වැළකෙමු.
- **ආදර්ශමත් වෙමු :** අපේ වන්දනාව ආදර්ශමත් වීම, තවත් අයට වන්දනාවේ සංවරව හැසිරීමට උපකාරයක් වනු ඇත. ඔවුන් ද වන්දනාවට එක සිතින් සහභාගී වනු ඇත. ඇතැම් වැරදි ආදර්ශ ලබා දෙන පවුල් ජීවිත මඟින් වත්මන් තරුණ ප්‍රජාව තුළ පවුල නමැති වන්දනාවට බියක් ඇති කර ඇත.
- **යැදුමට මුල් තැන දෙමු :** අප වන්දනාවක දී මූලිකව ම සිදු කරන්නේ ආගමික වතාවත්වල නියැලීම යි. පවුල් ජීවිතය තුළත් ඒ අයුරින් යැදුමට මුල් තැන් දෙමු. සියලු අභියෝග, දුක් කරදර දිව්‍ය සංරක්ෂණයට භාර කරමු.

"එකට යදින පවුල එකට සිටියි."

**තීක්ෂණ පෙරේරා**
**ශ්‍රී හෘදයේ ආධුනිකාරාමය**
**'සිදුපියනිල', බණ්ඩාරවෙල.**

# කුරුළු පවුල

එක දවසක් මා දැක්කා
කුරුලු ජෝඩුවක්
කෝටු කැලි තුඩෙන් ගෙනෙනවා

මගේ ගෙදර වත්ත කොනේ
දොඩම් ගහේ ගස් දෙබලක
කූඩුව හදනවා දැක්කා



ලස්සන පොඩි කුරුලු කූඩුවක්
දෙන්නම හැදුවා

කූඩුව ඇතුලේ පුංචි කිරිල්ලී
ඉඳගෙන හිටියා
පුංචි කුරුල්ලා
ගී ගයමින් නැටුවා
දින දින ගෙවුනා
මම කන් දුන්නා
කීචි බීචි හඬ නැඟුනා

කුරුලු පියා කෑම ගෙනාවා
වටේ කැරකි කැරකි
පැටවුන් හට කැවුවා

පුංචි පැටවු කීචි බීචි ගෑවා
මව යි පියා යි ගී ගැයුවා
හරිම ලස්සනයි කුරුලු පවුල
හරි සතුටුයි අපි සැමට ම

**දිමිත්‍ර යොහාන් ප්‍රනාන්දු**
**5 වසර,**
**ශා. ජෝශප් විදුහල, මරදාන.**

# ඕං එහෙනං



නෙතඟින් ලෝකය දැකපු දිනේ සිට ඇස් පිය ගන්නා අතරතුරා
දුර දිග කෙටි ළඟ වන්දනා ගමනකි යා යුතු බව සිත පුරා දරා
ජීවන රෝදය කැරකෙයි පෙරළෙයි ගල්ගෙඩි කටු වැල් පාර පුරා
ඒ බව මතකය අමතක කළොතින් පාරෙන් ඉවතට වැටෙනු තිරා

සැප හමුවෙන්නා සිරි සැප ලැබෙනා දුක අමතක කර සුව විඳිනා
මකුළුට වුන දේ මතකයෙ තිබුණාත් එවන් දෙයක් යළි නො කරන්නා
හෝද හෝද මඩ ගොඩට දැම්මොත් ඉන් පල කිම දැ යි නොසිතන්නා
ගමන දුෂ්කර යි අනතුරු එමට යි පරිස්සමෙන් කඩිමුම පසු කෙරෙනා

නඩය හරි වගේ නඩේ ගුරා නැත වන්දනා ගමනකි අපි යන්නේ
අතීතය ගැන හරි උදම් අන අනා වත්මන නිකමුන් සේ ඉන්නේ
බල්ලා පිදුරු කන්නෙත් නැත කන ගොනාට එය නොම දෙන්නේ
ගමන කචල් බොල මගින් නතර කර වෙන මගකට දා ගනු බැරියේ

උදේ නගින හිරු හවසට බැස යයි යළි හෙට උදයේ පායන්නේ
තව එක දවසක් දවසින් දවසම ජීවන ගමනේ අපි යන්නේ
ගමන යා යුතු යි ගමනේ නිමාව කවදා කොතැනක නොම දන්නේ
ඒ වග නොසිතන සිත සිත වැලපෙන උන් හැමදා ඉන්නට වලි කන්නේ

මට මම මගෙ ගොඩ මට ම බදා ගෙන මම ඉස්මතු වන්නට යන්නේ
අපේ ය අපි ම ය අපේ එකෙක් බව අමතක කර ජීවත් වන්නේ
වැටකට ඉන්නට ඉඩමට කඩමට හිලවු මඟුල් නැති කර ගන්නේ
කුමට ද මිනිසුනේ සුබ ගමනක් යන දින අමතක කර පවු'ලා ගන්නේ

සුබ ගමනක් යමු හොඳ මිනිසුන් වෙමු ජීවන මග හෙළි කර ගනිමු
අපට ලොවක් ඇත ලොව ගමනක් ඇත වන්දනා ගමනක් කර ගනිමු
වඳිමු පුදමු පින් දෙමු සොයුරන් සේ එක පවුලක් සේ ගත කරමු
හැමදා ඉන්නට බැරි බව සිහි කර කෙටි කල සතුටින් ගත කරමු

නේසන් ඔයස් - සූරිය


# ගමනේ යා...

කොහේ යන්නෙද කියලා ඇහුවම
බොහෝ විට පිළිතුරක් තිබුණා
මල්ලෙ පොල් පිළිතුරක් තිබුණත්
නොකීවත් ගමනේම යෙදුණා

දිගම දිගු චාරිකා සමහර
අතරමග නැවතිලා තිබුණා
ජීවිතේ පිනි බින්දුවක් බං
රමණි මරණිය අතර රැඳෙනා


ගහ මරාගත් අමනාපකම්
දිග්ගැසිය යුතු යැයි සිතේ නම්
එතරම්ම මේ හුස්ම පොද අපෙ
තිබේදැයි කිව්හැකිද නෙ බං

හීන තිබුණත් මහා බරටම
බෙලි කඩාගෙන ට්‍රයි කරත් මං
හුස්ම හිර වෙනවා වගේ බං
දැනෙනවා මේ කඳු කයේ දැං




චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම ........



# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



ආදර දුවේ පුතේ,

ඔයාලා වන්දනා ගමන් ගිහින් තියෙනවා නේද? වන්දනා ගමනක් යද්දි, සතුට වගේම ගෞරවය සහ භක්තියත්, සාමූහිකත්වයේ හැඟීමත් අප තුළ තියෙනවා. අතීතයේ අපේ ආච්චිලා, සීයලා තලවිල, මඩු, තේවත්ත, මාතර වැනි දේවස්ථානවලට වන්දනා ගමන් ගියේ පුදුමාකාර භක්තියකින්. කැපවීමකින්. ඒ වගේම එවැනි ගමන් වඩාත් සාර්ථක වුණේ එකමුතු මුතු ඇමුණුම නිසා.

වන්දනා ගමනක් කියන්නෙ සිද්ධස්ථාන වැඳ පුදාගන්න යන ගමනක් විතරක් ම නෙවෙයි. අප මනුෂ්‍යත්වය වෙනුවෙන්, එක්සත්ව එක්සිත්ව යන හැම ගමනක් ම වන්දනා ගමනක්. අද මම ඔයාලට කියන්නෙ එවැනි ලෝකයම බලා හිටි මනුෂ්‍යත්වයේ වන්දනා ගමනක් ගැන. දූලා පුතාලා දන්නවනේ පලස්තීනයේ, ගාසා තීරයට ඊශ්‍රායලය නොකඩවා ප්‍රහාර එල්ල කරන බව. මේ වන විටත් සිය දහස් ගණනක් මිනිසුන්, දරුවන් ඝාතනයට ලක් වෙලා. ආබාධිත වෙලා. ගාසා තීරයට ආහාර, ඖෂධ, වතුර ලැබෙන්නෙ නැහැ. කුසගින්නෙන් මිනිසුන් මිය යන තත්ත්වයට පත්වෙලා.

ගාසා තීරයේ අසරණ වූ මිනිසුන්, දරුවන් වෙනුවෙන් ආහාර, ඖෂධ, ළදරුවන් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රැගෙන යාත්‍රාවක නැගුණු මිනිසුන් දොළොස් දෙනෙකු පසුගිය ජූනි 01 වෙනිදා ඉතාලියේ සිසිලි දූපතේ සිට පලස්තීනය බලා ගමන් කරනවා. ඔවුන් ලෝකයේ විවිධ රටවලින් එක් වූ සමාජ ක්‍රියාකාරීන්.

අද මම ඔබට විශේෂයෙන් කියන්නෙ ඒ දොළොස් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමේ සිටි ළාබාල යෞවනිය ගැන. ඇය නමින් ග්‍රේටා තුන්බර්ග්. නව යොවුන් පරිසර ක්‍රියාකාරිනියක්. 2003 වසරේ ජනවාරි 03වන දා ඇය ස්වීඩනයේ උපත ලබන්නෙ. ඇය දේශගුණ විපර්යාස පිළිබඳව ලෝකයේ අවධානය යොමු කරන්න හඬ නගන්නෙ පාසල් දැරියක සමයේ සිට යි. දේශගුණ විපර්යාස පිළිබඳව සැලකිලිමත් වන්නැයි පාර්ලිමේන්තුව ඉදිරිපිට ගොස් හඬ නගන්නට තරම් ඇය දිරිමත් වුණා. ඇය සෑම සිකුරාදාවක ම පාසල් නොගොස් සොබාදහමේ සුරක්ෂිත බව වෙනුවෙන් ක්‍රියාකාරී වුණා. ''අනාගතය වෙනුවෙන් සිකුරාදා'' ලෙසින් නම් වූ එම පරිසර වැඩසටහන සමග එක්වුණු පාසල් සිසුන් පරිසර ක්‍රියාකාරීන් බවට පත්වුණා. යුරෝපය පුරා පරිසරය වෙනුවෙන් වැඩ කරන ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කරන්න ඇය මූලික වුණා. මේ වන විට ඇය ලෝකයේ ම ජනප්‍රිය තරුණියක්.

පරිසර හිතකාමී ජීවන රටාවක් අනුගමනය කරන ඇය හැකිතාක් පරිසරයට අහිතකර වායු, පොලිතින්, ප්ලාස්ටික් පරිසරය වෙත මුදාහැරීමට සිදුවන ක්‍රියාවන්ගෙන් වැළකිලා ඉන්නවා. ඇය අලුතින් කිසිවිටක ඇඳුම් මිල දී නොගන්නේත් එය පරිසරයට අනවශ්‍ය බරක් වෙන නිසා. අපේ ජීවන රටාව සරල සහ අල්පේච්ඡ වනවා නම් එය සොබාදහමට ලොකු අස්වැසිල්ලක් වේවි.

ග්‍රේටා තමන්ගෙ ජනප්‍රිය බව සහ ක්‍රියාකාරීත්වය පලස්තීනයේ පීඩිතව සිටින මිනිසුන් වෙනුවෙන් හඬ නගන්න යොදා ගැනීම නිර්භය තීරණයක්. ඔවුන්ගේ මනුෂ්‍යත්වයේ යාත්‍රාව ඊශ්‍රායල අත්අඩංගුවට පත්වෙනවා. සිරභාරයට ගන්නා ග්‍රේටාව ඊශ්‍රායලයෙන් පිටුවහල් කරනවා. නමුත් ඇය ලෝකයට දුන්නු පණිවිඩය නම් සිරභාරයට ගන්නවත්, පිටුවහල් කරන්නවත් බැහැ. ඒ තමයි මනුෂ්‍යත්වය වෙනුවෙන් නො බියව ඉදිරිපත් වෙන්න, පෙරට යන්න. හඬ නගන්න. මනුෂ්‍යත්වය වෙනුවෙන් යාත්‍රා කරන්න.



තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 86

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | | | 4 | ■ | 5 |
| | ■ | | ■ | | ■ | ■ | | ■ | |
| 6 | | | | | ■ | 7 | ■ | 8 | |
| | ■ | | ■ | 9 | 10 | | 11 | ■ | |
| 12 | | ■ | 13 | ■ | 14 | | | 15 | ■ |
| | ■ | 16 | | ■ | | ■ | 17 | | 18 |
| 19 | | | ■ | 20 | | 21 | | ■ | |
| ■ | ■ | ■ | 22 | ■ | 23 | | | | ■ |
| 24 | 25 | ■ | | ■ | | ■ | | ■ | 26 |
| 27 | | | | | ■ | 28 | | | |

හරහට

1. මේ මහ පොළොව මත කිතුනු අපි ගෙවන ජීවිතය .................................... .
6. ටිබෙටයේ ආධ්‍යාත්මික නායකයා.
8. මිනිස් ගහනය නිසා අනතුරට ලක් වී ඇති සත්ව කොට්ඨාසයකි.
9. පාවුලු තුමා සිය ධර්මදූත චාරිකාවන්හිදී කොර වූ පුද්ගලයෙකු සුව කළ ප්‍රදේශය.
12. ශබ්දය ඇසීමට උපකාරී වන ශරීර අවයවය.
14. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පානයකි.
16. "පානය" යන්නට සමාන පදයකි.
17. ජලය රැගෙන යාමට භාවිතා වේ.
19. විද්‍යුත් ගාමක බලය මනින ඒකකය.
20. ආලෝකය ලබා ගැනීමට භාවිතා කරයි.
23. ඇඹිලිපිටිය පසුකර කතරගම දෙසට යන විට මුණ ගැසෙන නගරයකි.
24. වී ඇටයක බර.
27. කිතුනු අපගේ සදාතනික වාසය.
28. පවුලක් එකට ජීවත්වන ස්ථානය.

පහළට

1. කිතුනු අපි බලාපොරොත්තුවේ ................. වෙමු.
2. වී පොතු.
3. කැළෑවල වැවෙන විශාල ගසකි.
4. "ඇයි?" යන්නට සමාන අරුත් දේ.
5. මෙම වසරේ කිතුනුවන් ක්‍රිස්තුස් වහන්සේගේ දෙදහස් විසිපස් වන උපන්දින ............... සමරමු.
7. වරකට ගත යුතු බෙහෙත් ප්‍රමාණය.
10. පලමු ප්‍රාණපරිත්‍යාගීවරයා
11. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දායක වන කඳුකරයේ ජීවත් වන්නෙකි.
13. මසුන් ඇල්ලීමට බිලිකටුවේ අමුණන ගොදුර.
15. මුහුදේ ඇති වේ.
16. උඩරට එළවළුවකි.
18. "නැවත"
21. පලතුරකි / වර්ණයකි.
22. ස්වර්ග රාජ්‍යය දිනා ගැනීමට මෙලොව මෙම මාර්ගයේ ගමන් කළ යුතු ය.
24. පෘථිවියේ මතුපිට තිබේ.
25. "අලුත්".
26. "ශරීරය".

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා,**
මැසනඩ් ඉංග්‍රීසි අධ්‍යාපන ආයතනය,
කටුවපිටිය, මීගමුව.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, 2025 ජූලි 31 ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්**, රු.2000.00, රු.1500.00, රු.1000.00 බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 86**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර,**
**මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 84 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 එ | ඩේ | 2 රු | | 3 ඔ | ස් | කා | 4 රො | 5 මේ | 6 රෝ |
| ල් | | 7 ව | ර | ක් | | | 8 බෝ | ග | ස් |
| 9 නි | ව | න් | | 10 ක | ර | 11 ල | | | |
| නෝ | | ධා | | ම් | | 12 ති | ස් | 13 ස | |
| | | ව | | 14 පි | | න් | | න් | |
| 15 ප්‍රා | ග් | | 16 මී | ටි | | 17 ඇ | ග් | න | 18 ස් |
| ණ | | 19 ත | ල | ය | | මෙ | | 20 ස | ම |
| 21 ඇ | න් | ද | | | 22 දි | රි | 23 ය | | ර |
| ප | | | 24 ඇ | ල | ස් | කා | ව | | ණ |
| 25 ය | මු | නා | | | 26 න | ව | | 27 හ | ය |

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමග
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email:bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 84 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 84 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - ඉමෙත් ගෙත්මිර ද සිල්වා, 9 ශ්‍රේණිය, මාරිස්ස්ටෙල්ලා විද්‍යාලය, තිඹිරිගස්කටුව.
- **දෙවන ස්ථානය** - නෙතුෂ රශ්මික, 11 ශ්‍රේණිය, සිරිකුරුස විද්‍යාලය, කළුතර.
- **තෙවන ස්ථානය** - ඩබ්. ඒ. සෙනුලි දෙහංස, 9 ශ්‍රේණිය, ශු. පවුලේ කන්‍යාරාමය, කළුතර.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2025 සැප්තැම්බර් / ඔක්තෝබර් - "අපේ ජ්‍යෙෂ්ඨයෝ"**
(සැප්තැම්බර් - ඔක්තෝබර් කලාපය සඳහා ඔබ එවන ලිපි ජූලි 15ට පෙර අප වෙත එවන්න.)

**2025 නොවැම්බර් / දෙසැම්බර් - "ජීවිත සුරකින සාමය ද? ජීවිත නසන යුද්ධය ද?"**
(නොවැම්බර් - දෙසැම්බර් කලාපය සඳහා ඔබ එවන ලිපි සැප්තැම්බර් 15ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) බරබ්බාස් නැමති මිනීමරුවා ව නිදහස් කළේ කවුරුන් වෙනුවට ද?
(i) පිලාත් (ii) ජෝශප් (iii) ජේසුස් වහන්සේ (iv) සිමියොන්

(02) "ජේසු නසරේනු ජුදයන්ගේ රජ" මෙහි කෙටි යෙදුම සඳහන් වන පිළිතුර සොයන්න.
(i) IRNI (ii) INRI (iii) IMRI (iv) INIR

(03) "ජේසුස් වහන්ස, ඔබ රාජශ්‍රීයෙන් වඩනා කල මා සිහි කළ මැනව" මෙය කා විසින් කියන ලද්දක් ද?
(i) ලාසරස් විසින් ක්‍රිස්තුන් වහන්සේට (ii) අනනියස් විසින් ක්‍රිස්තුන් වහන්සේට
(iii) ජේසුස් වහන්සේ අසල සිටි කාන්තාවක් (iv) ජේසුස් වහන්සේ දෙපස සිටි එක් වරදකරුවෙක්

(04) ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ ප්‍රථම සාක්ෂිකාරිය කවුද?
(i) මග්දලාහි මරියා (ii) මාර්තා (iii) මරියතුමිය (iv) වෙරෝනිකා

(05) ජේසුස් වහන්සේ අපෝස්තුලුවරුන් වෙත පව් කමා කිරීමේ බලය දානය කළේ කවදා ද?
(i) මහ බ්‍රහස්පතින්දා (ii) මහ සිකුරාදා (iii) ගොබ් ඉරිදා (iv) පාස්කු ඉරිදා

(06) ශුද්ධාත්ම වරම් ලැබූ අයෙකු සමාන වන්නේ කාටද?
(i) හමුදා භටයකුට (ii) අපෝස්තුලුවරයකුට (iii) උපස්ථායකුට (iv) ගෝලයකුට

(07) ශුද්ධ වූ සභාවේ උපන්දිනය කවදා ද?
(i) ගොබ් ඉරිදා (ii) පෙන්තකොස්ත දිනය (iii) නත්තල් දිනය (iv) පාස්කු ඉරුදින

(08) සහනාධාර බෙදාදීම සඳහා අපෝස්තුලුවරුන් විසින් පත් කරන ලද්දේ කවුරුන්ව ද?
(i) සෙරාබ්වරු (ii) දිවැසිවරු (iii) උපස්ථායකයන් (iv) ගෝලයන්

(09) අපෝස්තුලුවරුන් දොළොස්දෙනා අතරින් පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා කවුරු ද?
(i) සීමොන් තුමා (ii) පේදුරු තුමා
(iii) ජූඩ් තුමා (iv) මහා ජාකොබ් තුමා

(10) ශුද්ධ වූ පාවුලු තුමා අයත් ගෝත්‍රය වන්නේ ?
(i) ජුදා ගෝත්‍රය (ii) බෙන්ජමින්ගේ ගෝත්‍රය
(iii) ජෝශප්ගේ ගෝත්‍රය (iv) දාන්ගේ ගෝත්‍රය

(11) පේදුරු තුමාගේ මහා ප්‍රකාශය සිදු වූයේ කොහේ දී ද?
(i) පිලිප්පි කයිසාරියේ දී (ii) පිසීදියේ දී (iii) ලුස්ත්‍රාවේ දී (iv) මසිදෝනියේ දී

(12) පාපය නැති කිරීම සංකේතවත් කිරීමට යොදාගෙන ඇත්තේ කුමක් ද?
(i) දේදුන්න (ii) ගින්දර (iii) සර්පයාගේ හිස පොඩි කිරීම (iv) බැටළුවා

(13) ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ වන්නේ කෙසේ ද?
(i) කුරුසපත් වීමෙන් (ii) මහ බ්‍රහස්පතින්දා
(iii) දේව මාලිගාවේ ඔප්පු කිරීමෙන් (iv) බෞතිස්ම ස්නාපනයෙන්

(14) අපෝස්තුලුවරයා යන්නෙහි අර්ථය කුමක් ද?
(i) තෝරාගත් තැනැත්තා (ii) යවනු ලැබූ තැනැත්තා
(iii) ගැලවුම්කාරයා (iv) මඟ පෙන්වන්නා

(15) ලංකාවට පැමිණි පලමු ධර්මදූත කණ්ඩායමේ සිටි ගණන කීයද?
(i) 5 කි. (ii) 3 කි. (iii) 7 කි. (iv) 4 කි.

(16) මරියා මිරැන්ඩා කාගේ මව ද?
(i) ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගේ (ii) මාර්තාගේ
(iii) ජුසේවාස් පියතුමාගේ (iv) මැක්සි විලියම් කෝල්බේ පියතුමාගේ

(17) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාව භාග්‍යවරයට එසවීම සඳහා ලංකාවට පැමිණි ශුද්ධෝත්තම පියතුමා කවුරුන් ද?
(i) I වන ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා (ii) XXIII වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා
(iii) XVI බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා (iv) II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා

(18) ශු. ජුසේවාස් මුනිතුමා අයත් පූජක නිකාය කුමක් ද?
(i) ෆ්‍රැන්සිස්කානු (ii) ඔරතෝරියානු (iii) අගුස්තීනු (iv) ජේසු නිකාය

(19) ජේසුස් වහන්සේගේ කරපිට තැබූ කුරුසිය උසුලාගෙන යාමට උදව් වූයේ කවුරුන් ද?
(i) ජාකොබ් ය. (ii) අරුමැතියායේ ජෝශප් ය. (iii) සිරේනියේ සීමොන් ය. (iv) කයිපාස් ය.

(20) "මාගේ ස්වාමිනී මාගේ දෙවියනී" යන වගන්තිය උච්චාරණය කර තම විශ්වාසය ප්‍රබල ලෙස ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?
(i) පේදුරු තුමා (ii) ජාකොබ් තුමා (iii) ජුවාම් තුමා (iv) තෝමස් තුමා

**පිළිතුරු**


| | | | |
|---|---|---|---|
| (01) iii | (02) ii | (03) iv | (04) i |
| (05) iv | (06) i | (07) ii | (08) iii |
| (09) iv | (10) ii | (11) i | (12) iii |
| (13) ii | (14) iii | (15) i | (16) iii |
| (17) iv | (18) ii | (19) iii | (20) iv |

**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමතී සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම X

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

## සමදර්ශක සුභාරංචි



සමදර්ශක සුබාරංචි යනු කවරේද? ඒවා සම්බන්ධව ගැටලු හා එම ගැටලුවලට හේතු වූ විවිධ මත පසුගිය කලාපය මඟින් පෙන්වා දී ඇත. මෙම කලාපයෙන් සාකච්ඡා කෙරෙන්නේ සමදර්ශක සුබාරංචි අතර සහ සමදර්ශක හා ජොහාන් සුබාරංචි අතර වෙනස්කම් හා සමානකම් ය.

<u>සමදර්ශක සුබාරංචි අතර සමානකම්</u>

සුබාරංචි අධ්‍යනය කිරීමේ දී එම කතුවරුන්ගේ ආකල්ප සහ භාෂා ශෛලියන් අධ්‍යනය කළ යුතු ය. මාක්, මතෙව්, ලූක් සමාන දර්ශක සහිත ව ලියැවුණු සුබාරංචි වේ. මෙහි අන්තර්ගතය ක්‍රිස්තුස් වහන්සේ ගලීලයේ සිට ජෙරුසලම දක්වා යන ගමනක සිදුවීම් පෙන්වා දේ. ගලීලයේ ජෙරුසලමේ දූත මෙහෙවරේ යෙදුණ ක්‍රිස්තුස් වහන්සේ සම්බන්ධ ව මාක් සුපුවත පවසන දෙය ම ලූක් හා මතෙව් සුපුවත් කතුවරුන් ද පෙන්වා දේ. එම නිසා මාක් සුබාරංචිය ආභාසයෙන් මතෙව් හා ලූක් තොරතුරු ගෙන තම සුවිශේෂ රචනා කර ඇත. මාක් සුබාරංචියේ නොමැති ලූක්ට හා මතෙව්ට පොදු වගන්ති 220 කි. එයට හේතුවක් වන්නේ Q (කිව්) මූලාශ්‍රයකි. ක්‍රිස්තු පුවත් ලෙස සැලකෙන එම මූලාශ්‍රය විවිධ සිද්ධීන් විස්තර කිරීමේ දී ක්‍රිස්තුන් වහන්සේගේ වචන, ඉගැන්වීම් ඉදිරිපත් කිරීමක් ද වේ. ඉහත විග්‍රහයට අනුව පහත සඳහන් සමානකම් පෙන්වා දිය හැක.

1. ලූක්, මාක්, මතෙව් යන තිදෙනා ම ක්‍රිස්තුස් වහන්සේගේ දූත සේවය ගලීලයේ සිදු වී ඇති බවත්, උන් වහන්සේගේ සේවයට හා ඉගැන්වීම්වලට විශේෂත්වයක් දී ඇත.
2. ක්‍රිස්තුස් වහන්සේ පෙන්වා දුන් දේව රාජ්‍යයේ සදාතනිකත්වය තිදෙනා ම භාවිත කරමින් දේව රාජ්‍යය කුමක් දැයි වටහා දීමට සුපුවත් ත්‍රිත්වයේ ම උපමා මඟින් විස්තර කරයි (මතෙව් 5:17).
3. ක්‍රිස්තුස් වහන්සේ කළ රෝග සුව කිරීමේ ප්‍රාතිහාර්යය සුපුවත් තුනේ ම ඉදිරිපත් කර ඇත. උදාහරණයක් ලෙස අංශභාග රෝගියා සුව කිරීම මතෙව් 9:1-8, මාක් 2:1-12, ලූක් 5:17-26 හි වගේ ම අශුද්ධාත්ම ආවේශ වූ පුද්ගලයන් සම්බන්ධව ද සුපුවත් තුනේ ම සඳහන් වේ.
4. ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, උකුත්වීම හා උත්ථාන වීම සුබාරංචි 3ම සඳහන් වේ.
5. සුපුවත් කතුවරුන් තිදෙනා ම ක්‍රිස්තුන් වහන්සේගේ දේව පුත්‍ර භාවය හා මනුෂ්‍ය පුත්‍ර භාවය ඉස්මතු කරයි.

ඉහත සමානතාවලට අමතර ව මාක් සුබාරංචියේ ඇති වගන්ති 52 හැර සෙසු සියල්ල මතෙව් සුබාරංචියේ ද පෙන්වා දේ. එසේ ම ලූක් සුපුවත අධ්‍යනය කර බැලීමේ දී මාක් සුබාරංචියේ කරුණු 60%ක් පමණ උකහාගෙන ඇත. එම නිසා මාක් සුබාරංචිය අනෙක් සුබාරංචිවල අත්පිටපත ලෙස සැලකිය හැකි ය.

<u>සමදර්ශක සුබාරංචි අතර අසමානතා</u>

1. එක් එක් කතුවරයාගේ ආකල්ප මත, පරමාර්ථවල වෙනස්කම් මත එම සුපුවත් සැකසී ඇත.
2. ඇතැම් සුබාරංචිවල ඇතැම් කරුණු දක්නට නොමැත. උදාහරණයක් ලෙස ලූක් සුබාරංචියේ ක්‍රිස්තු උපත ප්‍රථමයෙන් දැනුම් දී ඇත්තේ එඬේරුන්ට යි. එම නිසා ක්‍රිස්තුන් වහන්සේ වැඳ පුදා ගැනීමට ලූක්ට අනුව මුලින් ම පැමිණ ඇත්තේ එඬේරුන් ය. මතෙව් සුබාරංචියේ එඬේරුන්ගේ පැමිණීමක් සඳහන් නොවේ. එහි සඳහන් වන්නේ ශාස්ත්‍රවන්තයගේ පැමිණීම සම්බන්ධ ව ය.
3. සුබාරංචි රචනා වී ඇති සැකැස්ම අනුව ද වෙනස්කම් ඇත. නිදසුනක් ලෙස මතෙව් තුමා ක්‍රිස්තුස් වහන්සේගේ දේශනා කොටස් 5 කට බෙදා පැහැදිලි කරයි. එහෙත් අනෙක් සුපුවත්වල එවැන්නක් දක්නට නැත.
4. ලූක් තුමා සහ මතෙව් තුමා ක්‍රිස්තුස් වහන්සේගේ උපත පිළිබඳව ලියා ඇත. එහෙත් මාක් තුමා උපත පිළිබඳව ලියා නොමැත. ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය හා මරණය සම්බන්ධව මාක් සුබාරංචියේ පරිච්ඡේද බොහෝ ප්‍රමාණයක් වෙන් කර ඇතැත් අනෙක් සුපුවත් දෙකෙහි ඒ සම්බන්ධ ව ලියැවී ඇත්තේ කෙටියෙනි.
5. මතෙව් තුමා හෙරෝද් පාලන සමයේ සිදු වූ ළදරු ඝාතනය පිළිබඳ ලියා ඇත. අනෙකුත් සුපුවත්වල එවැන්නක් සඳහන් වී නොමැත.

<u>සමදර්ශක සුබාරංචි සහ ජොහාන් සුබාරංචිය අතර සමානතා</u>

1. ස්නාවක ජොහාන් තුමාගේ දූත මෙහෙවර පිළිබඳව ජොහාන් 1:32-34 සහ මාක් 1:9-11 පැහැදිලි කරයි.
2. සමදර්ශක සුබාරංචිවල මෙන් ම ජොහාන් සුබාරංචියේ ද ජේසුස් වහන්සේගේ මුල් ශ්‍රාවකයන් පිළිබඳ සඳහන් වේ.
3. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යය (පන්දහසකට කෑම දීම) සහ ගලීල මුහුද මත ඇවිදීම තවත් සමානකමකි.
4. ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය, මරණය හා උත්ථානය සෑම සුබාරංචියක ම ඉදිරිපත් කර ඇත.

ඉහත කරුණු අධ්‍යනය කිරීමේ දී පෙනීයන කරුණක් වන්නේ ජොහාන් සුබාරංචිය මතෙව්, මාක්, ලූක් යන සුබාරංචි සමඟ යම් සබඳතාවක් පෙන්වන බවකි. මේ සම්බන්ධව බයිබලීය විශාරදයන් අතර මත දෙකක් පවතී.

1. ජොහාන් සුබාරංචියේ කතුවරයා මෙන් ම මාක් සුබාරංචි කතුවරයා ද එකම මූලාශ්‍රයකින් කරුණු ලබාගෙන ඇති බව යි.
2. ජොහාන් කතුවරයා ප්‍රධාන වශයෙන් මාක් සුබාරංචියෙන් ද සුළු වශයෙන් මතෙව් හා ලූක් සුබාරංචිවලින් ද කරුණු උකහාගෙන ඇති බව ය.

<u>සමදර්ශක හා ජොහාන් සුබාරංචි අතර අසමානතා</u>

1. ජොහාන් සුබාරංචියේ ගැඹුරු දේව ධර්මයක් ඉදිරිපත් කරන අතර එතුමන්ගේ තේමාව වී ඇත්තේ සදාතන ජීවිතය යි.
2. සමදර්ශක සුබාරංචි ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර ගලීලයේ දී සිදු වී ඇති බවට කරුණු ඉදිරිපත් කරයි. එහෙත් ජොහාන් සුබාරංචිය ඉදිරිපත් කරන්නේ ජෙරුසලමේ දී එම දූත සේවය සිදු වූ බව ය.
3. සමදර්ශකවල නොමැති ජොහාන්ට පමණක් ආවේණික වූ ප්‍රාතිහාර්යය කිහිපයක් ඇත. එනම් කානා නුවර දී ජලය මිදි යුෂ බවට හැරවීම, බෙත්සයිදා නුවර කොර වූ මිනිසා සුවපත් කිරීම, ජාත්‍යන්ධයන්ට පෙනීම ලබා දීම, ලාසරස් මරණයෙන් නැගිටවීම වැනි ප්‍රාතිහාර්යයන් ය.
4. දේව රාජ්‍යය පිළිබඳ සමදර්ශකවල සඳහන් පුවත් ජොහාන් සඳහන් කරන්නේ සදාතනික ජීවිතය යන්න ය.
5. ප්‍රාතිහාර්යයන් සඳහා ජොහාන් පෙන්වා දෙන්නේ සලකුණු යන වචනය යි.
6. "මම වෙමි" යන විශේෂ ප්‍රකාශන දැකිය හැක්කේ ජොහාන් සුබාරංචියේ පමණි.

සටහන : **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**

# BEST WISHES

AQUINAS | ACHS
COLLEGE OF HIGHER STUDIES
"Be Competent and Build Character"
ESTD 1954

## විශිෂ්ට වෘත්තියකට දොරටුව විවර කරමු!

## දිවයිනේ ප්‍රමුඛතම හා පැරණිතම සරසවියෙන් ඔබේ උපාධි සිහිනය සැබෑ කරගන්න

- BACHELOR OF ARTS (GENERAL)-ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය
- BACHELOR OF INFORMATION TECHNOLOGY (BIT)
- BSC (HONS) IN AGRO INDUSTRY MANAGEMENT
- BSC IN PSYCHOLOGY AND COUNSELLING
- B.ED (HONOURS) IN ENGLISH
- BA IN RELIGIOUS STUDIES

APPROVED BY
අධ්‍යාපන අමාත්‍යාංශය
MINISTRY OF EDUCATION
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
UNIVERSITY GRANTS COMMISSION

**උසස් පෙළ ප්‍රතිඵලය අනුව සම්පූර්ණ පාඨමාලා ගාස්තුව සඳහා ශිෂ්‍යත්ව අවස්ථා**

- අන්තර්ජාතික පිළිගැනීම සහිත උපාධි පාඨමාලාවන්
- සහනදායී පොලී රහිත ගෙවීමේ පහසුකම්
- ආරක්ෂිත නේවාසික පහසුකම්
- රැකියාවේ නියැළෙන අතර උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා පහසුකම



**වැඩිදුර තොරතුරු සඳහා අමතන්න**

077 156 4090
077 079 9170

0117 389 115 | www.aquinas.lk | No. 30, Gnanartha Pradeepa Mawatha, Maradana Road, Colombo 08.




මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස්. එස්. ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/02/2025